'දෙස රස බස යා - නොතරන පිණ යා'

වෙළුම | 1964 අගෝස්තු - 2508 නිකිණි | 5 කලබ.

සිල්වර්
එක්සයිඩ
බැටරි
24 මාසයෙක
වගකීම හා
සේවය.
සේවයේ
අර්ථයෙන්
සේවය කරන
ඔබේ
වෙළෙඳ නැන.
මිණැඩුම
කොළොඹ
ගම්පහ
මීගමුව

පටුන

පාසල් පොත්		129
රජයෙන් සළ කැරුම		159
රෝහණය	වෙල්ලාල ජයමහ	131
පැදි පතිණය		133
පාරිභාෂික පටලැවිල්ල		135
නො දියැ යුතු දන	එඩිවඩු	136
කටත් කැනත් නිසා වූ නඩු හබ	සඳසොමි ජයකුරු	137
හමුව (නළුවෙකි)	ඩයිරස් කුමාරසිංහ	139
ගංගා නදී ආදිය — 6	සිරිමල් රණවැල්ල	144
දළ සල කුමරු ගෙ සැරය		146
මගේ බළපිටි සමය — 6		147
ගුත්තිල ලකර (සරසවි පිවිසුම් පෙළ සඳහා)	සඳදස් කෝපරගේවා	149
ලක් ඉතිහසට රුකුල — 8 [දෙවු (G. C. E.) පෙළ සඳහා]	කමල්තිලක	151
මිතුරිය (පැදි)	අ. පොත්නම්පැරුම	152
දුහුන් පබඳ		153
අහදුව		155
පරයන් පැන්නුම (ගී)	සුනිල් සාන්ත	156
සාගර පළන්සූරිය ගේ 'ශ්‍රද්ධාව' [දෙවු (G. C. E.) පෙළ සඳහා]	නුවන්සිරි ජයකුරු	157
දවල් හීනය	පො. ආ. ස. විජයරත්න	160

සකසුවෝ— අරිසෙන් අහුබුදු
ලියනගේ ජිනදස්

මිල සත 50 යි.

සියලුම මෝටර් රථ උපකරණ

අමතර කොටස් හා

ටයර් ටියුබ් සඳහා යා යුතු තැන

මරදානේ

පංචිකාවත්ත පාරේ – 149

නෙල්සන් සහෝදරයෝ

ඔබ ගේ හඟව්ව

නුවනත් නුවණැත් අදින සේ

පළ කරවා–ගන්න් නම් දෙන්නෑ

එඩියට

පසු පිටුවෙහි වරකට	රු. 150.00 යි.
ඇතුළ ,, ,,	රු. 100.00 යි.
ඇතුළු පිටු ½ කෑ ,,	රු. 50.00 යි.
ඇතුළු පිටු ¼ කෑ ,,	රු. 25.00 යි.

විස්තර සඳහා සකසුවන් විමසන්නෑ.

ගල්කිස්සේ, හුළුදගොඩ පාරේ 20/1. එඩියෙහි සකසුවෝ.

5 වෙළුම
1964 අගෝස්තු

5 කලාප
2508 නිකිණි

පාසල් පොත්

රජයෙන් පළ කැරුම

'ඇත්ත වොක්ක අදින්න බැරි යැ. වෙතත් වොකු නොවදින්නට වැඩ කළ යුතු යැ' යනු සිංහල කියමනෙකි. වැඩක් වැරැදුණාට පසු හඬා වැලැපී පසුතැවී පලෙක් නැති. පායෙන් වැඩ නොවරදින්නට කටයුතු කළ යුතු යැ යනු මෙහි අදහස යි.

පාරිබාසික කම්මලේ ඇත්තන් ගෙන් හෙළ බස් මවට වැදුණු වොක්කේ ගායෙන් ම තව මැ පෙලෙන්නී යැ. රජයේ පතපොත මගින් ළමා පරපුරට වොක්කක් වදී නම් එහි විපා සැබැවින් මැ දරුණු විය හැකි යැ.

ළමා පතපොත රජයෙන් පහරවා දෙන්නට යැම් මැනැවි. වැඩේ හොඳට කැරෙනොත් ඉතා මැනැවි. එහෙත් මෙ කරුණු ද සැලැකිල්ලට ගත යුතු වෙයි.

මේ කැරෙනුයේ අත්හදා බැලීමෙක් ද? එසේ නම් සිහි එළවා පරිස්සමෙන් කළ යුත්තෙකි මේ.

උඩු ගුවන් තතු පිරියෙසුමට රුසියනුන් විසින් පළමු වැ අහසට යැවුණේ මිනිසෙක් නො වේ; බැල්ලකි.

සැත් කම් උගන්නා වෙද සිසුවෝ පළමු වැ ගෙම්බන්, මීයන් කපා පුරුදු වෙති. අලුත් ඔසුවක්, පිළියමක්, අහරක් වැන්නක් නොයාගැන මෙහි දී පළමු වැ මිනිසුන් නො වැ සතුන් මැ පිරියෙසුමට ලක් කොට බැලීම සි සිරිත.

වැඩුණු මිනිසුන් එක් අතෙකින් පිරියෙසුම්කට ලක් කළත් කමක් නැතැ යි කියමු. එහෙත් හැදෙන පරපුරේ දරුවන් පිරියෙසුමකට ලක් කැරෙනවා නම් ඒ ඉතා සැලැකිල්ලෙන් මැ කළ යුත්තෙකි. මේ ළමා පතපොත මගින් ඉගැන්විමෙහි ලා එන පරපුරට විපතක් වන විදියේ හෝ ඒ බවට යන්නම් සැකක් වන විදියේ හෝ පිරියෙසුම් නම් නොකළ යුතු මැ යැ.

රජයෙන් පැහැරැවෙන මේ ළමා පතපොත කවර නම් පදනමක් මතැ පිහිටිය යුතු ද?

ඉංගිරිසි වැනි අන් බසෙකැ ළමා පතපොත පිළිබඳ වැ නම් මේ පැනය නො නැගියැ

යුත්තෙකි. එහෙත් අද සිංහලයෙහි ලා නම් මේ නැගියැ යුතු මැ පැනයෙකි.

පසු ගිය කෑගලු සාහිත දිනයෙහි රජය මගින් පැහැරැවුණු පොතිකි මේ බවට කදිම දෙස් යැ. මේ ඉන් එකොකින් ගැනුණු වැකි පෙදෙස් යෑ:—

i මා කල්පනා කාලේ; මා ... අදහස් කාලේ...
ii බුවමනා දෙය කාලා; අපට උවමනා කරන...
iii මම හිතනවා ...; මා ඉවා ගන්නා. මා හිතන හැටියට...
iv රූගයක් බිහි කරනවා ... තනුවක් ඇති කරනව.
v අප බැලිය යුතු ... ක්‍රමය; අපි හඳුන්වන දෙය ...
vi ... කෝණයක් තියනවා; කොහොම වුත් ...

වියරණය පදනම් කොටැ නො ගෙනැ ලියැවෙන කවර පතපොතෙකැ වුව ද තතු මෙ සේ යැ. කණා කරන වෙඩි හරඹයක් වියරණ නොදන්නා කරන බස් හරඹයක් එක් බඳු යැ. මෙ බඳු විහිළු වළක්වන්නට නම් මුල සිටැ මැ දරුවන් අතට දියැ යුත්තේ වියරණහුරු පතපොත යැ. සාහිත දිනය වෙනුයෙන් රජයෙන් නිකුත් කැරුණු පොති-තිවලැ එන්නා සේ එකෙකැ දෙ විදියේ වියරණ යෙදුම් නො වියැ යුතු යැ; එකෙකැ තබා දෙකෙකැ වත් දෙ විදියේ වියරණ යෙදුම් නො වියැ යුතු යැ; පිළිගත් වියරණ පද-නාමෙකැ පිහිටා මැ ළමා පතපොත ලිවියැ යුතු යැ.

ළමයිනට සේ මැ ළමා පතපොතට ද තරගය ඉතා ඇවැසි දැයෙකි. මේ පොත් පළ කිරීම රජයෙන් කැරෙන හෙයින් එහි ලා කිසි මැ තරගයෙක් ඇති නො වේ. දැන් නම් ළමා පතපොත පළ කරන්නවුන් අතරේ ඇත්තේ මහ තරගයෙකි. තරගයෙහි පළ විසින් එක් පොත් පළ කරන්නෙක් අනෙක් පොත් පළ කරන්නාට වඩා හැම අතින් මැ උසස් වන සේ සිය කටයුත්ත කරන්නට බලයි. එ දුටු අනෙක් පොත් පළ කරන්නා ඔහු ගේ ඊළඟ පළ කිරීමෙන් සිය තරග කරැ පසු බස්සන්නට සියලු සැන යොදයි. මෙයින් වනුයේ කිමෙක් ද? ළමා පතපොතෝ කනුව දිනෙන් දිනැ උසස් වීම යි. රජයෙන් පමණක් මේ වැඩය කිරීමෙන් කිමෙක් වේ ද? පළ කිරීම එක මැ තැනින් හෙයින් තරගයේ දි කෙමෙන් උසස් වන පොත් පරපුරක් නැති වී යෑම යි.

තව ද වරදක් වියැ හැකි. රජයෙන් පළ කැරෙන මේ පොත් ලියවන්නෝ කවුරු ද? ඔහු නම් සිංහල හෝඩියේ අකුරු ගණන වත් හරි හැටි නොදන්නා පෙළේ උසස් නිලධාරියෝ යි. ලියන්නෝ නම් මේ සිංහල නොදන්නා නිලධාරියන් විසින් සිංහල දන්-නවුන් යැ යි තෝරාගැනෙන කිහිප දෙනෙකි. 'රුවන් මිල නොදත් අනුවණ දන වෙළෙඳ— ලොබින් කද මැටි මිණි යැ යි රැගත් ලෙද' යැ යි අලගියවන්න රාලහාමින් කී තෝරා-ගැනුම මෙහි ලා ද ගැලැපෙන සේ යැ. එ හෙයින් මෙ ළමා පතපොත ලියනු සඳහා රජයේ මිනුම් දඬුයෙන් කැරෙන මිනීමේ දි හොඳ මැ ගත් ලියන්නා හැළි යා හැකි යැ. මෙයින් වනුයේ අඳුනනවනා පොත් ලිවීමෙක් වැළැක්ම යි.

යටත් විජිත යුගයෙහි මේ රටේ හෙළ දරුවනට "ආංඩුවේ කියැවීම් පොත්" නමින් පොත් පෙළක් වූ බව දනුමු. සයිමන් ද සිල්වා වාසල මුදලි තුමන් විසින් ලියැවුණු ඒ පොත් පෙළ රජයේ පාසල්හි ඉගැන්වුණු බව ද දනිමු. එහෙත් ඒ පොත් මැ ගත යුතු මැ යැ යි මුළු රටට කැරුණු බල කිරීමෙක් එ ද නො වී. එ හෙයිනි ශික්ෂා මාර්ගය වැනි උසස් කියවීම් පොත් පෙළකුත් කුමරතුඟු මුනිදසුන් වැනි උසස් ගත්කරුවකුත් පහළ වී තැගී ආයේ. මේ පිළිවෙළින් නම් මතු එ වැන්නකට සිහිනෙනුදු ඉඩ ලැබේ ද යනු සැක යැ.

රජයේ මේ පත්පොත් නිසා පාරිබාසික කම්මලට ද හොඳ දසාවක් උදා වනු ඇති. මේ කම්මලේ ඇත්තෝ මුල සිටැ මැ සිය බසේ පරම සතුරෝ යැ. සිංහලය ඉල්ලූ අයට එ නමින් පාරිබාෂාවක් පටවා සිංහලයෙන් වැඩ කිරීම තිත්ත කරවන මුතුමූ තනත

'රෝහණය'

~ හෙළදිවෙ ඉපැරැණි බෙදුමක් වූ රුහුණට එ නම ආ සැටිත් ඉන් හෙළි වන ආදි හෙළයන් ගේ තතුත් දක්වන මෙ ලිපිය එළියේ 3 වෙළුමේ මිගුල් කලඹින් (1951 සැප්තැම්බර) ගැනුණෙකි ~

වෙල්ලාල ජයමහ

මේ 'රෝහණ' යන්න තරම්, හෙළ තෙරුවනේ උසස තසා, යසස වසා එතුන තද අඳුරට කැඳවා ඔහ පිරිහුමෙහි රුඳැවූ අන් වදනක් නැතැ යි සිතම්හ. මෙයට මුල් වූ ගුරු වූ ඒ හේළි හෙළ වදන නො නැසී පැවැතුණා නම් හෙළ රුස පටන් ගත්තේ විජයගෙ සහ සොර පිරිසිනැ යි ද සියලු විදු කලා හෙළදිවට පැමිණියේ දඹදිවිනැ යි ද යන දෙ මහ බෙරුව කිසි කලෙකැ මේ රටේ තැනක් නො ලබයි. කුමක් කෙරෙමු ද?

ලොවැ සියල්ල බිඳේ මැ යැ. එ දහමට හෙළ තෙ රුවන ද යටත් මැ යැ. හෙළයෝ පැරැදුණෝ යැ. හෙළ සතුරෝ දිනුවෝ යැ. දිනූ ඔහු දහන් ගණන් සතු වදන් පාළි වදන් නැගුවෝ යැ. එ ගැමට මුල් වූ ගුරු වූ හෙළ වදන් මැරුණෝ යැ. මෙහි ලා මේ ඇඳුරන් බොහෝ විටැ ගත්තේ ගත හැකි ඉතා පහළ මැ මඟ යැ. උන් නිපැදූවූ සතු වදනෙහි හෝ පාළි වදනෙහි හෝ අරුත එකෙකි. එයට මුල් වූ හෙළ වදයෙහි අරුත අනෙකකි. එබඳු දහසක් වදන් අතර මේ 'රෝහණ' යන්න ද එකෙකි.

කිහිප වරක් වූ මිහි සැලුම්වලට හසු වැ දෙස කුඩා වැ රුස දුබුල් වැ පවැති සමයෙකැ හෙළ සතුරු දඹදිවියෝ ඉනුදු වෙසෙසින් පරම සතුරු දෙමළුවෝ බුදු සමයෙන් ද, ඇතැම් රජුන් ගේ වැඩි රු දෙසින් ද පිහිට ලබා මෙහි වදින්නට වූ හ.

එ ද රුසක් විසින් වෙන් වැ පෙනී සිටින්නට පිරිස් බලයක් නැති ඔහු දූන් ජේ පුර වැසි හිමි කම් ඉල්ලා නොහැගුණෝ යැ. මේ රටට හෙළදිව යැ කියනවාටත් මෙහි වැසි එක මැ රුස හෙළ රුස යැ යි හැඳින්වෙනවාටත් කිසිවක් නො බිණූ හ; තව ද හෙළදිවැ හෙළයන් සතු සෙසු සියලු හිමිකම්දු තමනට නුදුන් හ යි කිපී දඹදිවැ වෙසෙන තම නෑයන් ලවා තරවටු ද නො කැරවූ හ.

දූන් දකුණු හෙළදිවටත් වඩා එ ද උතුරු හෙළදිව සපිරි හෙළ බිමෙක් වියැ. එ හෙයින් දූන් මඳ කලකට පෙර ජේ කැමැති කැමැති පරිදි හෙළ දිවට වැදගැනීමෙක් නො වී යැ එ ද හඩුවන් ගේ. එ සේ මැ දූන් සේ දිවා රෑ දෙක්හි හොරහොරා මෙහි ගොඩ වැදීමෙකුදු නො වී යැ. හෙළයෝ එ ද හඩුවන් මහත් සේ පිළිකුල් කළෝ යැ. 'බූ නැහිලී කෙළිය, පැටිකිත්තන් කෙළිය, වොල්පිටැ කෙළිය' ඈ අද ද පවත්නා හෙළ කෙළි ද, 'හඩුවා, දෙමළිච්චා, වොල්ලේ දුත්තා' ඈ වදන් ද එ ද හෙළයන් ගේ කො තරම් තද වෛරට පිළිකුලට හඩුවන් ලක් වූණා දැ යි පහයයි. එ හෙයින් එ ද උනට මෙහි වදින්නට තුබුණේ එක් දෙ තුන් මඟෙකි. එ ද එළියේ යැ. එ සේ අමාරුයෙන් පැමිණි ඔහු බැගැරියන් සේ මැ දිවි ගෙවූ හ මෙහි. නිකම් මැ නොවේ; මහ පොහොසත් ගෙදරකට මෙස් වලා පැමිණි සතුරු රුසක් මෙන් තමනට හැකි සියලු හදි හදමින් මැ දිවි ගෙවූ හ ඔහු මෙහි.

එ සේ පැමිණි හඩුවන් අතුරු බොරු සිල් පෑ ඇතැමෙක් තමනට එකතු කොටැගත හැකි තාක් සියලු පත් පොත් එකතු කොටැ ගමට පටවා හැම විදුවක් මැ කලාවක් මැ හෙළ දිවට පැමිණියේ දඹදිවිනැ යි කියන්නට සිය මූනුපුරනට ඉඩ ද සලසා සැනැසුණා හ. බලයට පැමිණි ඇතැමෙක් මෙහි දී මැ ඒ ගිනි ලැවූ හ. නැවැතැ රුස් කොටැ වැඩකට නො ගත හැකි වන සේ උනට මූනට පැගෙන්නට මහ මහැ විසිරුවූ හ. තව ද කෙනෙක් බුදු දහම් මුළු ලොවට පොදු කෙරෙමූ යි තමනට හැකි තාක් පොත් පාළියට පෙරළා ඒ පෙරළිල්ලට උදවු වූ ගුරු වූ මුල් හෙළ පොත් සියල්ල රුස් කරවා සියලු හෙළයන් ලවා සෑදූ කාර දෙවමින් මැ ඒ ගිනි බත් කැරුවූ හ. ඒ අළු ගොඩ බලා හද සතසා සිල් පිටින් මැ ගමට වැඩිය හ.

මෙසිනුදු හෙළ හද තමනට ගැති නුවූණා දූනැ බුදු සමයෙන් මූවහ වැ මෙහි වුසූ හෙළ සතුරෝ නැගී සිටිය හ. දඹදිවටත් දඹදිවියනටත් එ තෙක් හෙළ හදේ පැවැති මහ බර පිළිකුල බුදුන් වහන්සේ ගේ නමින් දුරු කැරුලන්නට බැලූ හ මහු. බුදුන් ඇතුළු එ මහ රහතුන් සියලු උසළුන් උපන්නේ දඹ දිවේ යැ යි ද, ඉන් එ බිම මැ ලොවැ ඉහළතම යැ යි ද බණ දෙසන්නට වූ හ. බුදුන් ගේ නමින් දෙසන්නට වූ හෙයින් එ බණ පල දිනි. "සුගත සිහි කළ වැඩ සරි වැ යේ!" හෙළයෝ එ තෙක් තමන් මහත් වෙරින් පිළිකුලෙන් සැලැකූ දඹදිව පුදන්නට වූ හ; එහි උපදිම්වා යි පතන්නට වූ හ.

එ බලා සිය දහස් ගුණෙන් දිරි වවාගත් නොමිතස් හුවාගත් ඔහු හෙළයන් මැරිල්ල සිය පැවිද්දට වරදක් නො සලසති යි සිතා දෙ එයට පුරා සැරුසුණා හ.

එ සේ සැරුසුණු ඔහු බුදුන් වහන්සේ ද, උන් වහන්සේ ගේ දහම ද, පුතුන් ද ඉදිරි පත් කොටැ තුමූ පිටු පසින් සිටැ හෙළයන් පැමිණියේ දඹදිවිනැ යි කියන්නට වූ හ. රජ සෙබෙහි ද, පන්සලෙහි ද, බණ මඩුයෙහි ද, ඇදුරු අස්නෙහි ද සිඳැ කියන්නට වූ හෙයින් ලොවේ මුල් මැ බොරු කීපයෙන් එකක් වූ මෙයට ද නැතක් ලැබෙන්නට විය. එ සේ ලැබුණු නැත නගවුරු කරන්නට ඔබින් පැමිණි සකු ඇදුරෝ ද මොබින් නැගුණු පාළි ඇදුරෝ ද තිපැදියාවන් දක්වන්නට වූ හ. ඒ තිපැදියාවනට අනුවැ හෙළයෝ සිංහලයන් වී හැමට ගැති වූ හ; තුමූ මැ නැති වූ හ එයින්.

එ සේ ගැති වී නැති වී ගිය සිංහලයන් කෙරෙහි වැඩෙන්නට වූ නිවට කම් බලා උන් සහමුලින් මැ දඹදිවට යට කොටැ තබන්නට නම් උනට පණ කවන උන් ගේ බස මැ පළමු කොටැ මැරියැ යුතු බව සැලැකූ හ සකු ඇදුරෝ. උන් කියන හැම බසකට මැ එහෙයි, එහෙයි' කියා හිස නමා උල් පත්දම් ඇල්ලූ හ පාළි ඇදුරෝ. ගෙවල් බිඳින සැහැසි සතුරු සොරුන් සෙමෙන් සෙමෙන් එහි එක් එක් ගල ගලවන්නා සේ හෙළ බස් මැදුර බිඳැ හෙළන්නට නැගුණු සද පසෙහි මැ ඇදුරෝ එහි එක් එක් වදන උදුරා මරලන්නට වූ හ.

එ සේ උන් මරාලූ හෙළ වදන් අතුරු හෙළ රජුන් ගේ, ඇමැතියන් ගේ, සෙනෙවියන් ගේ, සුදුවන් ගේ, පැවිද්දන් ගේ උවසුවන් ගේ නම් පමණෙක් ද වනුයේ? නැති, නැති. බොහෝ නුවර, ගම්, කඳු, ගං, ඇල, දෙළු ඈහි හෙළ නම් ද, දහස් ගණන් වේ මැ යැ.

සකු ඇදුරනුත් පාළි ඇදුරනුත් මේ 'රෝහණ' යන්න උපදවා එයට ගුරු වූ මුල් හෙළ වදන මරලීමෙන් පමණක් වුව ද හේළි හෙළ නෙ රුවනට ලැගුණු අඳුර මෙ තෙකැ යි කියන්නට පොහොසත් මිනිස් කටෙක් මේ මිහි පිටැ නැති. හෙළ රුස ලොවේ මුල් මැ හැදූණවුන් ගේ රුස බව, හෙළ හැදිගාව මුල් මැ හැදියාව බව, මුල් මැ මහ රදුණන්— මහ සම්මත මහ රදුණන්, හෙළයාණ කෙනෙකුන් බව බැලූ බැල්මට පැහැදිලි වැ මැ පෙන්වන දිමුතු කැඩපතක් බඳු අපේ හේළි හෙළ 'රොහොන්' සද මරා යැ මේ දෙ පසෙහි මැ ඇදුරන් 'රෝහණ' යන්න උපදවාලූයේ.

දූන් බලමූ මේ 'රොහොන්' යනු කෙසේ

පැදි පතිණය

මොහොට්ටි දෙණු දේවිදු
වෙල්ලාල ජයමහ

— වෙල්ලාල ජයමහ මහ කිවියෝ ගුරුදෙව් කුමරතුඟු මුනිදසුන් හා භුවමාරු කැරගත් පැදි පතිණ 'පතිණ මිහිය' නමින් පොතක් කොට පළ කළ හ. ඒ පොත පළ වූ තියාව ඇසූ එ වකැ වැලිපැන්නේ බුදුනු දෙ වග හික්හලේ දෙමු විහසු මොහොට්ටි දෙණු දේවිදු කිවිගාණෝ පහතැ පෙනෙන පතිණය වෙල්ලාලයනට යැවූ හ. —

ගොදුම් ගොත් සැසි'සි
  පිරිනිවුණු පසු දෙ ද හස්
සිවු සිය අසූ අට වස්
  ගුණු වසැ මතැ තවම් පුර-

තෙලෙස් වකැ ගුරු ද
  වැලිපැන්නේ වලගෙදර
පිහිටි පෙරළ සිරි හල තෙල
  බුදුනු දෙ වග හික්හලැ දී.

වෙල්ලාල ජයමහ
  මහ කිවියෙනි වියෙනි පක්
බව හිස් මතින් පැ යලි
  නොහිස් මතිනි තැණැ' ති බව්.

ගිය මසැ කොළොඹැ දී
  හෙළු හවුල් සමුළුව ද
බුදුනු මැඳුරත මතැ දී
  ඔබ කළ පිළිත මතක ද ?

ඔබ මතු ද තව තව
  හෙළ පැවියනුදු කව් මඟ
හදුනවා දක්වා එහි
  ලොවිතුරු කව් රසය පැ-

මා ගුරුදෙව් කුමර-
  තුඟු මුනිදසුන් හා ඔබ
හා පතිණයෙන් නත් විටැ
  ලියු උතුරු පිළිතුරු කව්-

ගතක් ලෙස පැහැරුම්
  දෙරින් බිහි වී ඇති බව්
නෙ පුවත් පතුඳ පවසා
  'පතිණ මිහියැ' යි නම් ලැබැ.

ඉන් පිටපතෙකි ඔබ
  අර මැඳුරෙහි දී මහ රැ
නුදුරැ මා පැදුරැ වැතිරි
  එවම් සි පිළිත දුන්නේ.

එ පිළිත බොරු යැ ඔබ
  සිතා ගැලැවුම් නොසිතනු.
ඔබ සැසි සස් බසැ පිහිටි
  අහුබුදුවෝ ද එ දනිති.

මේ සුළු දය වුව ද
  ඇහෙන් ඇටයක් යන සේ
ඔබ හට ඇහෙනු නොබැරි යැ.
  එහෙත් නො එවා එ බැරි යැ.

එන සැති ද කොළොඹ
  මම යම් එන ඔබ ද ඔබ
ඉන් එකක් නො කොටැ මා ලොබ
  රැගෙනැ විත් දී පින් ලබ!

මෙ ලියු නොහිස් මත
  හිස් මත්නි දුරැ දිරිමත්
වනුව තිරතුරු දිරි ලන
  මොහොට්ටි දෙණු දේවිදුහු.

1945. 1. 25
වැලිපැන්න, වලගෙදර

වෙල්ලාල ජයමහ මහ කිවියන් යැවූ පිළිතුර මේ යැ.

දේව්දූති තොප ගේ
තරවටු බසට හුරු කොටැ
බැඳුණ ගීයෙන් ලියැවුණ
පහිණය ලදුමු මේ දූත්.

නිඳි මත හැම මත මැ
තැනැ එන බව නො දතුහු ද?
එ හෙයින් එ මිතිනැ' වීසී
ම - කියූ හ යි ඔබ කියන-

පිළිතුය ගැනැ අපට
හරියට සඳහන් නැතත්
තොපට පහිණ මිහිඉයනෙ' ක්
පිටපතක් ගෙනැ දෙන්නමු.

දෙස් දෙනුව අහුබුදු
බස් පෙරට ගන්නට බැරි.
තොප ගේ එ පහිණය දුටු
විටැ සිටැ ඔහුට ගොළු වෙස්!

'රෝහණය'

(132 පිටුවෙනි)

නිපන්නෙක් ද යි.

රෝ පොත් — රොපොත් — රොහොත්.

මෙයැ එහි නිපැදියාව.

'රෝ පොත්' යනු 'හිරු පුත්' යන අරුත දිනී පුරැණු හෙළ බසේ.

කෙළින් මැ එ ද මැද-ගස්-කරය ඔස්සේ ද, සරසින් අරබිය, ගර-සිය, පිනිසියාව ඔස්සේ ද, ගිය ඒ ඉපැරැණි හෙළ හැදියාවේ එළිය ඉහළින් මැ ලැබූ මිසරයෙහි හිරු අරුතෙහි 'රෝ සද' එ ද යෙදුණේ යැ. අද ද යෙදෙති යි යෙති. මෙහි දු අදත් හිරු අරුතෙහි 'රෝ සද' දෙ තුන් පලෙකැ වත් නොයෙදෙත්තේ මැ නො වේ. ඉතින් කවුරු ද ලොවේ පහළ වූ මේ මුල් මැ හිරු පුතාණෝ? ඔහු නම් 'මහ සම්මත' මහ රදණෝ යැ; මුළු ලොවින් මැ හැදියාවට පත් වූ ඒ ආදි මැ හෙළයන් තුන් හෙළය අලලා තෝරාගෙනැ කිරුළු පැළැඳැවූ මුල් මහ හෙළයාණෝ යැ.

රැයට සඳක් ද දහවලට හිරක් ද වන-යට සිහියකු ද ඇතී බව බලා දේ නමනට ද නායකාණ කෙනකුන් වුව මැනැවැ යි තුන් හෙළය අලලා එ සේ තෝරා-ගත් තැනැත්තාණන් හිරු පුත් කොටැ තකන්නට ඒ ඉපැරැණි හෙළයන් කවර හෙයින් නැගුණා ද යි සෙවීම වටී.

මින් හවුරුදු දස දෙලොස් දහසකට පමණ පෙරැ විසූ හයි සිතීයැ හැකි තරු, බලි ඈ හෙළිපුරන් ද, මෙන් මැ එ ද ද යට ගිය යටගියා පුවතක් වූ මහ 'සම්මත උපත' ද, විසූ හෙළයෝ ද හිරු හැඳූහු හ. හෙළ කොල්ලක් මෙ තෙක් රැකැනෙනැ ආ එක්හරු හෙළ කෙළිගෙකැ දී කියන කියමනින් ඉපැරැණි හෙළයන් හිරු හැඳූහු බව හෙළි වෙයි. එ නොදත් හෙයින් ගිය ද 'මත්තායි' නුවරින්—එහි දු හෙළ තෙ විදතක් වියරු කොටැ නිපදවාගත් 'තිරුකෝනිශ්වරමින්' මතු වූ හටබුත් බලා එහි පැබැතියේ හිත්දු හැදියාවෙකැයි කී දෙමළුනට කිසි බසක් නො ලැබැ ගමට යන්නට ඉඩ ලැබුණේ.

ඉතින් හිරු හැඳූ ඒ හෙළයනට හිරුට වඩා ඉහළයෙක් වෙයි ද ලොවේ? නැති. එ හෙයින් ඒ ඉපැරැණි හෙළයන් මුල් මැ හෙළ රදණන් හැටියට එ සේ තෝරා-ගත් තැනැත්තාණන් කවර තමෙකින් සඳ-හමු දැ යි සලකා උන් සියලු තෙදින් ඔදින් විකුමෙන් පැරැකුමෙන් හරසරින් පුරා සැදෙනු පිණිසැ හෝ වේ වා සැදුණකු කොටැ තකනු පිණිසැ හෝ වේ වා උන් හිරු පුතා-ණන් කොටැ සැඳැහූ හ. එ සේ සඳහා එ ද බසින් උන් 'රෝ පොත්' යැ යි නම් කළ හ. මොහු යැ ලොවේ පහළ වූ මුල් මැ හිරු පුතාණෝත් රජාණෝත්. උන් ගේ ගොත යැ හිරු ගොත. එ හෙයින් එහි උරුමය හෙළ-දිවට මුත් දඹදිවට අයත් නො වේ.

උන් උපත් පෙදෙස ද 'රෝ පොත්' මැ සැලැකූ හ ඒ ඉපැරැණි හෙළයෝ. ඒ 'රොහොත්' යන්න මරා නමින් කිසි ද යෝරුමකට නැති වැදගැත්මකට නැති හඩු 'රුහුණු' යන්නක් නිපදවා මේ ඇදුරන් පහළ කළ 'රෝහණ' යන්නෙන් අපේ හේලි හෙළ තෙරුවනට සිදු වූ විපත ඉමහති.

පාරිභාෂික පටලැවිල්ල

රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට කිසි බසකට නැති 'පාරිභාෂික' 'ශබ්ද' යන්නෙක් සිංහලයා පිටැ පැටැවෙන්නේ යි.

'පාරිභාෂායෙන්' වැඩ ගන්නට නැකැනුවෝ අවුලෙන් අවුලට මැ වැටුණෝ යි. එහෙත් 'පාරිභාෂාව' රකින්නට සමහරු තැත් දැරූ හ. උනට නිසි පිළිතුරු සපයන්නට දේ රජයේ විදිලි අදිකංරියත්, ලංකා පිරිතෙල් මඩුල්ලත් සුදුසු හෙළ වදන් තනා වැඩට ගත් හ.

ඒ හෙළ සිප් වදන් හැකි තරමින් රටට දෙන්නට ගත් තැතෙකි මේ.

(ගිය කලඹිනි.)

strength, field පිටිසුරු සවිය
strip light තීරු පහන
structure සැටිය; සැටි (සැ+අටි)
structural සැටිසුරු
sub-head උප - හිස
sub-lease උප - බද්ද
submarine කුමුදුව; කුමුදු
submarine cable කිමිදි බහන; කිමිදි බහන්
subsidiary උපසිටු
substation උපපොළ
substation unit type එකු පන්නයේ උපපොල
substation, primary පළමුවැරි උපපොළ
suck උරයි (1)
superheat සුපිරිතැප (සු+පිරි+තැප)
super petrol සුපිරිතෙල් (සු+පිරි+තෙල්)
superintendent සුපිරික්සයි (1) (සු+පිරි+ඉක්ස)
superintendant සුපිරික්සු
superstructure සුපිරිසැටිය; සුපිරිසැටි (සු+පිරි+සැ+අටි)
supervise සුවික්සයි (1) (සු+ඉක්සු)
supervision සුවික්සුම; සුවික්සුම්
supervisor සුවික්සු
supervisory සුවික්සුයුරු
supervisory control සුවික්සුයුරු පැලුම
supervisory system සුවික්සුයුරු සැටිය
supplement පසුපුරුව: පසුපුරු (පසු+පුරුව)
supplementary පසුපිරුම්
supply සපයයි (1)
supply සපයුව; සපයු
spply and demand සපයුට හා ඉලියුම්

supply, bulk තොග සපයුව
supply, Electricity විදිලි සපයුව
supply line සපයු රැහැන
supply, power බලසපයුව
supply system සපයු සැටිය; සපයු සැටි
supress මඩි (5)
suppression මැඩුම; මැඩුම්
suppressor මඩනය; මඩන
suppressor grid මඩන කොටුමාව
suppressor, arc සැව් මඩනය
surge කලඹ
surge කැලැඹිය — කැලැඹි
surge absorber කැලැඹුම් සවුරුව; කැලැඹුම් සවුරු
surge chamber කැලැඹි ගබ - කැලැඹි ගප්
surge impedance කැලැඹි ගැහැටිය
surge divertor කැලැඹුම් දිහරවව; කැලැඹුම් දිහරවු
surge suppressor කැලැඹුම් මඩනය; කැලැඹුම් මඩන
survey මිනික්සයි (1) (මන්+ඉක්ස)
survey chain මිනික්සු දම්වැල-මිනික්සු දම්වැල්
surveying මිනික්සුම
survey, land ඉඩම් මිනික්සුව
survey, plaintable මැසි මිනික්සුව
suspend ඔලඹා (1)
supression ඔලැඹුම
suspender ඔලඹුව; ඔලඹු
swear දිවරයි (1)
swell ඉදිමේ (5)
switch වහරුවයි (1) (වහ+අරු)
switch වහරුව; වහරු
switchboard වහරුපුවරුව

නො දියැ යුතු දන

පරශනට පුරවැසි බව නොදෙමු

එළිවඩු

''අදනන දමනං දනං —
දනං සබ්බසා සාධකං''

යතුයෙන් දිමෙහි ගුණ කෙ තෙක් උසිත් මහතිත් දිගිත් පුළුලිත් කියුව ද ගැයුම ද, මෙය උතුමත් සසල-අනුත් සතසත-දනමෙකැ යි ලොබ ඔබත තුවණැස් පහයන මෙහෙකැ යි යතු වැත්තක් සලකා - ගත්තට ඉඩක් නැති කලැ - නො දියැ යුත්තක් නො දියැ හැක්කක් ඉල්ලන කලැ - ඉල්ලත්තහුට දියැ යුත්තේ කොත්ද හරහා පොදු පහරෙකි.

මේ රටේ ඉඩම් කඩම් ටිකත් පරයත් ගේ ගැ. ගහ-කොළත් පරයත් ගේ යැ. උසස් පහත් තනතුරැත් රැකියාවනුත් වෙළෙඳ වියපුරැත් පරයත් ගේ යැ. උත් ගේ අත් පල්ලෙත් හෝ පා පල්ලෙත් හෝ හැළුණු ඇදුණු තැනෙකැ රඳමිත්, උතට එපා වූ තනතුරක් දරමිත්, රැකියාවක් කරමිත්, වෙළෙඳ වියපුරැවෙකැ යෙදෙමිත්, උත් ඉතිරි කළ යමක් කා බී හැකැයි සියලු සුව උත් විඳුවමිත්, සියලු දුක් තුමූ වළඳමින්, මහ පහවලැ සොඳුරු මැඳුරුවලැ උත් සතපමින්, තුමූ අතු පැල්වලැ ලගිමින්, උසස් යාන-වාහනවලැ උත් වජඹවමින්, තුමූ පරණ බර කරත්තවලැ හිඳි කිරමින් මෙ කලැ සිංහලයෝ සියලු අතින් වැටෙති, එබෙති, පිරිහෙති

මෙ සේ සියලු අතින් වැටී-එබී-පිරිහී-ගිය සිංහලයත් දෙස බලා බිඳක් පමණ වත් මෙතක් කුලුණක් නො කැරැ හමටත් බුරන බල්ලත් සේ තැනැ තැනැ හිඳැ පරයත් ගුගුරන ගිගිරිලි බලවු.

මෙහෙකරැ කමට ගෙදරැ රඳවා-ගත්තහු හවුරුදු කිහිපයක් ගිය කලැ ඉඩමෙහි අසුවල් කොටස - ගස - වැල-මට වුව මනා යැ. ගෙහි අසුවල් අසුවල් කිලි-තැනැත්තත්-තැනැත්ති-යත් මට වුව මනා යැ' කියා ඉල්ලතොත් ගෙ-හිමියා පණ පිටත් සිටී නම්, හේ උමතු-වෙක් නො වේ නම් අර මෙහෙකරැවාට කිමෙක් ද, සිදු වනුයේ?

රත් රිදී මුතු මැණික් වතු කුඹුරු ඇ සියල්ලක් මැ දන් දෙමු. වුව මනා නම් ඇස් ඉස් මස් ලේ දිවි වුවත් දන් දෙමු. එහෙත් එක ද ඉන්දියානු දෙමළකුට වත් මේ හෙළ දිවේ පුර වැසි බව නො දෙමු. රත් රිදී මුතු මැණික් ඇ දන් දීමෙන් එ ලොව මෙ ලොව වැඩ සැදෙන බවක් අප ගේ ආගමය උගන්වයි. එහෙත් මූනට පුරවැසි බව දීමෙන් අපට මුහුදට පැන දිවි නසා - ගත්තට සිදු වන බව මැ මෙ තෙක් මේ රටේ වුණු දෑ යය රහට අප උගන්වයි.

බලවු මින් හවුරුදු සිය ගණනකට පෙරැ සිංහල රටක් වූ උතුරු පළාත දෙස. බලවු නැගෙනහිර පළාත දෙස. පුර වැසි බවක් නොදී මැ ඒ දෙ පළාත මැ අද අපේ යැ යි කියැ නො හැකි තරම් යැ. ඉතිත් දුනහොත් කිමෙක් වේ ද?

සිංහලයෙනි, ලක් මැණියත් ගේ බෙල්ල කපවු, පපුව පළවු, හදවත අදිවු. එහෙත් මෙහෙකරැ කමට මෙහි පැමිණියවුන් මේ පතියත් නො කරවු!

එළිය — 1948

විසැඳුම

ගෝලයා — ගුරුතුමෙනි රටක් ගමක් නැතියවුන් පිළිබඳ පැනයට
ඔබ ගේ විසැඳුම කිමෙක් ද?

ගුරුතුමා — රටෙකැ නීතියේ රැකුම එ රටැ පුරවැසියනට පමණෙක්
නම් ෂෘර වැසියනට කොහි ඉඩ?

කටත් පෑනත් නිසා වූ නඩු හබ

සඳසෝමි ජයකුරු

අදහස් දැක්වීමෙහි ලා කටත් පෑනත් නිදහසේ හැසිරවිය හැකි යැ යනු අද නිතර ඇසෙන හඬෙකි. ජන රජයු (ප්‍රජාතන්ත්‍ර වාදී) රටෙක වෙසෙන අපට ඒ නිදහස අයත් බව නොරහසෙකි. එහෙත් එහිත් ඉමක් ඇති බව නීතිය දෙස බලන අපට පැහැදිලි වේ. මෙය වෙසෙසින් මැ පෙනෙනුයේ අප තවත් කෙනකු ගැන ලියන කියන දා සබඳිනි.

අපට යමකු විවිසීමට ඉඩ ඇති බව හැබැයි. එහෙත් එය තරහින් කැරෙන විවිසුමක් වුව හොත් එයින් ඔහු වීහිළුවට හෝ පිළිකුලට හෝ බඳුන් වුව හොත්, නඩුවකට ඉඩ ඇති වේ. අපහස නඩු යනුයෙන් අප දන්නේ එවැනි නඩු යි. කටෙහි හෝ පෑනෙහි සීමාව ඉක්මැවූ විට ඇතී වන්නේ අපහස නඩු යි.

කතා කරන්නටත් ලියන්නටත් අප වෙසෙසි බලයක් ගත යුතු නො වේ. අපට යමක් ගැන හෝ යම් කෙනකු ගැන හෝ කතා කිරීමට ඇවැසි විට හතර පස් දෙනකු එකතු කැර-ගෙන ඒ ගැන දෙඩිය හැකි යැ. ලිවීම ද එ තරම් මැ පහසු යැ. යමක් ලියන්නට හිත ගිය තැනැත්තේ තමා ලියූ දෑය පතුරුවන්නට තැනක් සොයාගෙන පෑනෙහි හා කඩදසියෙහි හා පිහිටෙන් අදහස් පවසා එය පතුරුවාගනියි, මෙවුන් හැම කෙනකුට මැ ඉතා පහසුවෙන් තවත් කෙනකුට අපහසක් වන පරිදි ලිවිය හැකි; කතා කළ හැකි. කෙටි කතා කරුවකුට හෝ නවකතා කරුවකුට හෝ මෙය කළ හැකි යැ. කළු හෝ පොත් හෝ විවිසන්නකුට ද මෙය බැරි කටයුත්තෙක් නො වේ. මෙ වැනි දෙයින් පැන නැගුණු නඩු ඇතී.

අපහස කිරීම පිළිබඳ නීතියට පින් සිදුවන්නට, මේ අවසරයෙන් පල ලබන්නෝ ඉතා විරලය හ. නැති නම් අපහස කිරීමේ පහසුවෙන් අවසර ලබන්නට තැත් කරන්නන් මෙයට වඩා වැඩි වන්නට තිබිණි!

මෙහි අප ගේ කිස නීතිය පිළිබඳ සලකා බැලීමෙක් නො වේ. විදෙස් රටවලැ ඇති වූ පසිඳු අපහස නඩු කෙරෙහි ඔබේ ඇස ගැන්වීම යි. මේ කිස ඉටු කිරීමේ දී ඒ නඩුවලැ පැන නැගුණු බැරෑරුම් නිති පැන ගැන විවිසන්නට අපි බලාපොරොත්තු නො වෙමු. එහි රස මුසු තැන් ගෙන හැර පෑම අපේ බලාරොත්තුව යි. මෙ වැන්නෙක දී සිහිත් මැවිය හැකි විස්තරයෙක් නැති. එ හෙයින් පතපොත ඇසුරු කළ බව කිව මනා ද?

1. මළ නොමළ බවෙන් ඇති වූ රැල්ස්ටන් හා උච්ල්ලෝ නඩු

පණ පිටින් සිටි කෙනකු මළ බව පළ කිරීමෙන් ඇතිවූ නඩු දෙකෙකි.

රැල්ස්ටන් මහත්මිය ගේ නඩුව 1950 දී ඇසිණි. මෙයට හේතු වූ කරුණු පුදුමය දනවයි. රැල්ස්ටන් දෙ පළ 1894 දී විවා වූ යුවලෙකි. 1899 දී ඔවුන් නීති අනුව වෙන් වූයේ දරුවන් දෙ දෙනකු ද බිහි වූ පසු යි. සැමියා ත් බිරියත් පෙදෙස් දෙකෙක පදිංචියට ගිය හ. බිරිය ගේ කල දනාව හොඳ වීම නිසා දේ වැඩි කලක් යන්නට පෙර ඇගේ මැ සමාගමෙක සබාපති හා දෙටු කළමනාකරු හැටියට තැනක් ලැබීමට ඇයට හැකි විය.

දිනක් ඇයට අා ආරංචියෙකි; ඇගේ සැමියා පදිංචි පෙදෙසේ මිනිපිටියෙකු තනා තිබුණු සමරු පුවරුවක් ගැන පුවතෙකි. ඒ පුවත අනුව කටයුතු කළ ඕ ඒ පෙදෙසට ගොස් සමරු පුවරුව බලන්නට ගියා ය. එය ඇගේ සැමියා වන රැල්ස්ටන් ගේ "පෙම්බර බිරිය වන ජෙනී" සිහි වීමට ඉදි කැරුණු සමරුවක් බව පෙනීගිය විට ඇය පුදුම වූයේ රැල්ස්ටන් ගේ එක ම බිරිය ඇය පමණක් බව හොඳින් දැන සිටි නිසා ය. ඇගේ නම ඊඩිත් මෝඩි විය.

මේ සමරුව දකින කෙනකුට ඇති වන හැඟුම් දෙ අපූරු වෙයි.

1. ඇය මියගොස් ඇති බව ය. එ විට රැල්ස්ටන් මහත්මිය යනුවෙන් හැඳින්වෙන ඇය වෙන තැනැත්තියකු යන හැඟීම ඇති වේ.
2. ඇය රැල්ස්ටන් මහතා සමඟ නීතිය අනුව විවාහ වී නැති බව යි:

උව්‍රිල්ලෝ නඩුව සිත්තරකු ගැන විය. ඔහු ගේ නම මොරිස් උව්‍රිල්ලෝ ය. ලංඩනයේ ටේට් කලාභවනයේ පැවැත්වූ සිත්තම් දැක්මක් සඳහා පැහැරුවුණු නම් ඉද්දෙකින් මේ නඩුව පැනනැගිණි.

උව්‍රිල්ලෝ බේබද්දකු වූ බවත්, ඔහු කීප වරක් ම මැඩපවත්වා තැබීමට සිදු වූ බවත්, 1919 සිට මැරෙන තුරු ඔහු නීති රකුවන් ගේ පිරික්සුමට බඳුන් වූ බවත් සඳහන් වී. පින්තූර පත්වලින් සිත්තම් ඇද සමාජ ශාලා හිමියනට බීම සඳහා ඒවා විකුණු බව ද ඔහු 1934 දී මියගිය බව ද එහි සඳහන් විය.

මෙය පළ වූ විට උව්‍රිල්ලෝ පණ පිටින් සිටියේ ය. 1934 දී මියගිය ස්පාඤ්ඤ ලිපියුවකු (ලේඛකයකු) වන මිගුවෙල් උව්‍රිල්ලෝ ගේ මරනය නිසා මේ අවුල ඇති වූ බව පසු ව හෙළි විය. අවුල දුටු හැටියේ ම නම් ඉද්ද බෙදීම අත්හිටවන ලද නමුත්, උව්‍රිල්ලෝ විසින් පවරන ලද නඩුවෙහි දී පිළිතුරු දීමට කලා භවනයේ අදිකාරීහු ඉදිරිපත් වූහ.

මරනය පිළිබඳ කොටස හැර එ ම කැබියෙහි අනෙක් කොටස් සියල්ල ම ඇත්ත බව ඔවුහු කියා සිටියහ. මෙය ඔප්පු කිරීමට උව්‍රිල්ලෝ ගේ තරුණ වියෙහි බීමත් කම

එ හෙයින් රැල්ස්ටන් මහත්මිය ඇය ගේ සැමියාට විරුද්ධ ව අපහස නඩුවක් පැවරීම කවර පුදුමයෙක් ද? එහෙත් අවාසනාවකට මෙන් නඩුවේ මුල් අවදියේ ම ඇති වූ බාධාවෙකි. බිරියට සැමියාට විරුද්ධ ව නඩු පැවරීමට ඉඩ නැත යි එ කල නීතියෙක් පැවැතිණි. එහෙත් තමා ගේ දේපළවලට රැක්මට හානිකර වන්නක් ගැන නඩු පැවරීමට ඉඩ තිබිණි. එ හෙයින් ඇය පවත්වාගෙන යන වෙළෙඳ ව්‍යාපාරයට මේ අපහසය හානිකර වූ බව ඇයට ඔප්පු කිරීමට සිදු විය.

ඇගේ නීතිඥතුමා (නීතිඥයා) මහත් වෙහෙස දැරී ය. එහෙත් මේ නඩුව ඇසූ මැක්නෝටන් ආදිපාදවරයා කියා සිටියේ ඇය කැරගෙන යන ව්‍යාපාරය පාලනය කිරීමට පතිවත ඉතා ඇවැසි නොවන බව යි. රැල්ස්ටන් මහත්මිය නඩුවෙන් පැරදුණු නමුත්, සමරු පුවරුවෙන් සිය නම මකාදැමීම සඳහා රැල්ස්ටන් මහතා ගේ සිත හැරවීමට ඇය ගේ නඩුව සමත් විය.

නිසා සිදු වූ හදි පිළිබඳ ලඝිස්තුවක් ද ඔවුහු ඉදිරිපත් කළහ. ඔහු නිතර ම මත් පැනින් පෙඟී සිටි බවත්, මත් පැන් ලබාගත නොහැකි වූ විට, වයින් ඉස්පිරිතු, පැට්රෝල්, ඕඩි කොලෝං ආදිය ද බිවූ බවත් ඔවුහු කීහ. විදුරුවක් බෝතලයක් ළඟ තබාගෙන පාරේ සිට සිත්තම් ඇඳීමට ඔහු පුරුදු ව සිටි බවත්, බෝතලය ඉවර වූ විට තවත් මත් පැන් ලබාගැනීමට ගිය බවත් විත්තිය වෙනුවෙන් පැවසිණි. බීමත්කම නිසා උව්‍රිල්ලෝ හිර අඩස්සියට ගන්නා ලද බවත්, බීමත්කමට පිළියම් ලබන ගිලන්හල්හි පිළියම් ලැබූ බවත් සාක්ෂිවල දී හෙළි විය.

මේ චෝදනාවලට බඳුන් වූ කරුණු කවුරුත් දැනසිටියහ. නඩුව අසන විට මේ චෝදනා ඔප්පු කිරීම වැළැක්වීමට පැමිණිල්ලේ නීතිඥතුමෝ වෑයම් කළහ. එහෙත් චෝදනා නඩුවට අදාළ වන බව තීන්දු විය. නඩුව ඇසීම වැළැක්වූණේ, පැමිණිල්ල හා විත්තිය හා අතර සමාදානයක් ඇති වූ හෙයිනි. උව්‍රිල්ලෝ පසු ව මත් පැන් බීමෙන් වැළැකී සිටි බව හෙළි වීම සමාදානයට හේතු වූ වැදගත් කරුණෙක් විය. විත්තිය විසින් එළියේ කරන ලද කමාවෙන් උව්‍රිල්ලෝ සෑහීමට පත් විය.

හමුව

ගැමුණු සමය අළලා
ලියැවුණු නළුවෙකි.

ඩයිරස් කුමාරසිංහ

1 රඟිය

තැන - සිරි මහ බෝ මළුව

මහලු පියෙක් සිය දුව — සිතිරා - හා පැමිණ බෝ ගස වැඳ-පුදගනී.

සිතිරා - (මේ ගීය ගයයි.)

සුවඳ මලිනි පුද කරමු බැතිනි වැඳ
සිරි මහ බෝ සමිඳු
සැසි තිලෝගුරු හිමි පිරිබෝ කළ
සිරි මහ බෝ සමිඳු

සසුන රකින සැම දෙවියෝ මේ පින්
අනුමෝදන් වෙත් වා
සසුන මකන පර සතුරන් ගෙන් අප
හෙළ දූ රැකැදෙත් වා !

සැනැසිල්ලේ වැඳැ-පිදුමට අප හට
ඉඩ කඩ සැලැසේ වා !
දෙව් සැප කෙළවර නිවනේ අම සුව
මේ පින ගෙනැ දේ වා !

[දෙමළ නිලදූරියෙක් මෙහෙකරුවකු ද කැටි වැ එයි. ගීය අසා ඈ දෙස මැ නෙත් අලවා සිටැ මෙහෙකරුවාට අණ දෙයි.]

නිලදූරියා— මෙහෙකරුව, මේ මහල්ලා මෙ තැනින් ගෙන යනු.

මෙහෙකරු— හොඳ ම යි - එනු [මහල්ලා ගේ අතින් අල්ලා ඇදගෙනැ යන්නට සැරසෙයි]

මහල්ලා— කොහි යන්න ද?

මෙහෙ— යන තැන දන හැකි යි. එනු!

නිල— [වේගවත් ලෙස] මහල්ලා වහා ම ගෙන යනු.

සිතිරා— අදින්නට එපා මගේ පියා පෙනෙන්නේ නැද්ද වයස? අප එනවා. යමු තාත්තේ. [සිතිරා පියාට වහා ළං වෙයි.]

නිල— තී කොහි යන්න ද? තී මෙහි රැඳිය යුතු යි.

සිතී— මට බැහැ

නිල— මට බැහැ! [මහ හඬින් සිනා සී] තී දන්නේ නැද්ද මෙහි තියෙන්නේ අපේ රජය බව? මෙහෙකරුව, ඇදගෙන යනු මේ මහලු හැව! කෙල්ල ඈත් වෙනු ජර මහල්ලා ගෙන්!

සිතී— ඈත් නො වෙමි මගේ පියා ගෙන්.

නිල— ඈත් වෙනු!

සිතී— එම්බල, දෙමළ! මගේ පියා ගෙන් මා ඈත් කරන්නට තෝ? අත හරිනු මගේ පියා අත හරිනු!

නිල— [සිය කඩුව කොපුවෙන් ගෙනැ] එම්බල කෙල්ල ඈත් වෙනු! තිගේ පියා පණ පිටින් යනවා දක්නට නොකැමැති නම් ඔහුට ළං වෙනු!

[තරුණියා ඈත් වෙයි.]

නිල— ගෙන යනු! [මෙහෙකරුවා මහල්ලා ගෙනැ යයි.]

නිල— [කුලුණු ගුණ අඟවමින්] සිංහල කෙල්ල බය වෙන්න එපා. පියාට උවදුරක් කරන්-නේ නැ. මා සමඟ එනු. [කඩුව කොපුවේ ලාගනී] තිගේ රුව කවරකු නම් තිගේ වසගයට නො ලයි ද? තිගේ නිල් නෙත් දෙක! සුදු සිනිඳු අත් දෙක! [දෙමළා සිතිරා ගේ අත ගන්නට සැරසෙත් මැ ඕ පස්සට පැනැ දෙඩන්නට වෙයි]

සිති— මේ සිරිමා බෝ සමිඳුන් බලා සිටියැ දී මගේ ඇඟට අත තබන්නට එපා.

නිල— එ සේ නම් මිත් ඉවත් වමු.

සිති— යහපති, කොහි යමු ද?

නිල— එන්න සොඳුර, මා නිවේසට එන්න මේ පැත්තෙන්.

[සිතිරු ඔහුට ළං වැ යන්නී අවසරයක් බලා එක් වර මැ ඔහු ගේ කඩුව කොපු-වෙන් ඇදගනී.]

සිති--[කඩුව දෙමළාට එල්ල කරමින්] හිටිනු! නො සැලී සිටිනු!

(තිරය වැටෙයි)

2 රඟිය

තැන -- රුහුණේ මංසන්දියෙකි.

[මහල්ලා පැමිණේ. තුරුණුවෙක් හමු වේ.]

තුරුණුවා-- සියා !

මහල්ලා-- අනේ බලන්න ළමයා, අර පරයන් මගේ දුව ගෙනැ ගියා.

තු— පර දෙමළුන්! රුහුණට ඇවිත්?

ම— නැ නැ පුතේ මා ගියා මගේ දුවත් එක්ක සිරිමා බෝ වඳින්න.

තු-- ඇත් එක්ක ද ගියේ? අසා නැද්ද දෙම-ළුන් එහි කරන අපරාද?

ම -- අනේ පුතේ මා කො තෙකුත් කිවා ඈට එන්න එපා යැ කියා. මා තනි ව ම යන නිසා ඈ ඇත් ආවා. ඇටත් පිරිමියකුට වගේ හරඹ පුරුදු නිසා මාත් ඔහේ එන්න ඇරියා. අපොයි, වුණු වැරැද්ද? අනේ මගේ දුව!

තු-- සියේ දූත් නැවිලා ඇති වැඩෙක් නැ. කුමරුවන් වහන්සේ කොත්මලේ සිටැ ඇවිත් ඔන්න දූත් හරි වැඩ! මාත් මේ පරයන් ගෙන් රට බේරා ගැනීමේ හටනට යන්න යි හදන්නේ.

[අණ බෙර හඬෙක් ඇසේ]

තු— හා ඔය එන්නේ ඒ අණ බෙරේ තමයි.

බෙරකරු-- [පැමිණෙමින්, බෙරය හඬවමින්] ඩං! ඩං! ඩං! රුහුණු රට කරවන අප දේවයන් වහන්සේ අණ දෙවා වදරන වග යි.... අඩ සිය වසක් තිස්සේ රටත් දැයත් සසුනත් කන හඬුවත් ගෙන් තුන් සිංහලය බේරාගැනීමේ මහ රණ කෙළියට මුළු රට මැ සැරැසියැ යුතු වග යි.... කඩු හරඹ, දුනු හරඹ ඈ අවි හරඹ කරුවන්, අහසට පැන කරන විසි කරණම්ගි සුරු-වන්, අසරුවන්, ඇතරුවන් වෙදුන්, මතුරුකරුවන්, මායාකරුවන් ආදී විදු-දරයන් කොටින් මැ අවියක් නගා ගත හැකි හැම හෙළ කොල්ලකු මැ හෙට ඉර හැරී පස් පැයක් ගිය තැනැ මාගම්පුරැ රජ මිදුල් තැන්නට රැස් වියැ යුතු වග යි...

[බෙර කරු යෙයි]

ම-- අනේ, හෙළ කොල්ලන් පමණෙක් ද වුව මනා?

තු— ඇයි අහන්නේ?

ම -- මටත් යන්න.

තු-- සියා හුහක් නාකි නොවැ?

ම -- නාකි! මේ රවුල කැපුවා ම මගේ නාකි කම එ හරම පේන්නේ නැ.

තු-- කුදේ?

ම -- කුදේ කෙළින් වේ වි කඩුව ගත්තා ම?

තු— එහෙනම් යමු!

[අඹු සැමි යුවළෙක් එති]

අඹුව-- දේවයන් වහන්සේ ගේ අණ ඇහුණා නොවැ? හෙට යන්නට ඕනැ රණ කෙළියට.

සැමියා— ඔබත් දරුවනුත් ගැනැ තමා මගේ දුක.

අ -- මාත් අප දරුවනුත් ගැනැ පමණෙක් ද ඔබ දුක් වන්නේ? සියලු හෙළ ගැහැනු-නුත් සියලු හෙළ දරුවනුත් මතු ඇති වන්නට ඉන්නා සියලු හෙළයනුත් වෙනු-යෙන් ඔබ දුක් වියැ යුතු යි. ඒ නිසා මැ මේ හටනට යා යුතු යි. මාත් එනවා දරුවනුත් කැටිවැ මැ හෙට ඔබ රණ කෙළි පුරුදු පුහුණු වෙන හැටි බලන්නට

දුන් ගිහින් තාගෙනැ එන්න. [සැමියා යෙයි.]

මැහැල්ලක් පැමිණේ.

මැහැල්ල[එහි උන් තරුණ ළඳ අමතා] සෝමා, අපේ ළමයින් එහෙම මෙහේ දුටුවා ද?

සෝ— නෑ.

මැ -- ඇහුණා ද මේ පලාත හොලවාගෙනැ ගිය අණ බෙරය?

සෝ— ඔව්!

මැ -- මගේ කොල්ලන් දෙන්නාටත් එය ඇහුණා ද දන්නේ නෑ.

සෝ-- ඇයි අම්මා බය ද උන් ඒ අහනවාට?

මැ -- නෑ දුවේ, උන් ඒ ඇහුවේ නැත්නම් කොහොම හරි කියාලා එක පිටත් කරන්න ඕනෑ. ගැනු අපට බැරි යැ කුඹුරු අස්-වද්දගන්න? මටත් පුළුවන් උන් දෙන්-නාට ම වඩා කුඹුරු වැඩ. හා, ඔන එන්නෙ මගේ පොඩි එකාත්!

කොලුවා— [ඊඩ පනිමින්] මාත් යනවා, මාත් යනවා අම්මා, අක්කා යුද්දෙට!

සෝ-- මල්ලී තව ම පොඩි එකා නේ? දෙමළුත් පොඩි ළමයින් අහු වුණොත් බිල්ලට ගෙනැ යනවා!

කො — හම්බ වේ වි! තනි මට පුළුවන් අක්කා අම්මා දෙමළුන් පස් දෙනකුට වග කියන්න

මැ — පුතා හරි නපතා. එන්න වඩාගන්න. මාත්යනවා පුතා වඩාගෙනැ රණ කෙළි-යට.

සෝ-- යමු, යමු අපි කවුරුත් යමු.

3 රණිය

තැන - සිංහල කඳවුර; **වේලාව - සවස**

සිංහල සෙබළෝ ගී ගයති. එක් එක් සෙබළා තම තපත් නම් අක්වන ඒක් එක් ගි කැඩිය බැගින් ගයද් දී සෙසු සෙබළු පුනගැයිය ගයමින් හවුල් වෙති.

අනිත්ත පැනැ ආ කුළු මී වැස්සී
අගින් මෑ අල්ලා බෙල්ල කැඩුයේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි.

ගේන පාළු කළ කන් කොට ගෝනා
හිස වට බඹවා පොළොවට ගැසුයේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි.

නාඹුල් තල් ගස් දෙක දුනට ගෙනැ
එක හුස්මට උගුලා බිම දමුයේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි.

පොල් ගස් සොලවා ගෙඩි බිම ලන්නේ
මහ කළු ගල් ගෙඩි පන්දට ගන්නේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි!

වැලි මිරිකාලා තෙල් ඇර ගත්තේ
යකඩ කඳන් මිරිකා දිය ගත්තේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි!

ගාල කඩන්නට ආ වල් අලියා
වල්ගෙන් ඇදැගෙනැ ගමට ගෙනායේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි!

රා කළ ගෙඩි විසි හතරක් හිස් කොටැ
එහෙම පිටින් වල් ඌරකු ගිල්ලේ
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි.

අහසට පැනැ විසි කරණම් දක්වා
සොළියා පර සක්වළේ ගසන්නේ-
මෙන්න මම යි—
මෙන්න මම යි, බල, මෙන්න මම යි.

[ගැමුණු කුමරු පැමිණෙයි]
කවුරුත් නිහඬ වෙති.

ගැමුණු— එම්බා මා ගේ සෝදයෙනි, සිංහල වීරයෙනි, ඇයි ගී ගැයුම් නැවැත්වූයේ? මා ආවේත් තොප හා එක් වන්නට යි. පිඩා ගතව සිතට ගිය අමා ඔසුවෙනි. ගයවු! ගයවු!

තවත් කියැ යුත්තෙකි. මේ තව මැ හටකෙකි පටන් ගැන්ම යි. නියම හටන්-

නියම නැටුම් ගැයුම් ඇත්තේ පසුවට යි. අපේ රට, අපේ දය, අපේ සමය, අපේ සියල්ල පරයාට යටත් වැ තිබියැ දී එක් අතෙකින් කවර නැටුම් ද අපට?

අද අප නටන්නේ මේ සිංහල ගම සතුරා ගෙන් ගලවා ගත් සොම්නසට යි. එහෙත් හෙට අප සිටියැ යුත්තේ ජය ගී ගැයියැ යුත්තේ - කඳවුරු බැඳියැ යුත්තේ අන්න අර පෙනෙන කදු ගැටය මුදුනේ යැ. හෙට උදේ ම ඒ පෙනෙන ගම්මානය අල්ලාගත යුතු යි. ඉතින් අදට වඩා හෙට කට යුතු වැඩි වියැ හැකි යි. එ හෙයින් ගතෙහි සිතෙහි විඩා හැරෙන ලෙසකුත් අප බලා ගත යුතු යි.

සෙනෙවියෙක්— [පෙරට විත්] දේවයන් වහන්ස, අද අප අල්ලාගත් මේ ගමේ කිහිප දෙනෙක් ඔවුන් ගේ නැටුම්-ගැයුම්-වලින් ඔබ වහන්සේ පිනැවීමට අවසර පතති.

ගැමුණු— එන්නට කියනු. කාගේත් විඩා ඇරෙන්නට ඒ හොඳ මඟෙකි.

සෙබලෙක් — [පැමිණැ] අවසර දේවයන් වහන්ස, තරුණ සොලී තිලදූරියෙක් ඔබ හමු වීමට ඇවිත් සිටී!

ගැ.— සොලියෙක්! ඌ එහි සිටීම ගුණ මදි! ඌ පලමු වැ මෙහි කැඳවනු!

ඵුස්සදෙව— දේවයෙනි, සොලියා උපායෙහි සමතෙකි. අප සෙවිල්ලේ කටයුතු කල යුතු යැ.

දෙමල තිලදූරියා කැවී වැ සෙබලා ඒ. දෙමල තිලදූරියා ගැමුණු කුමරුට 'ආචාර' දක්වයි.

ගැ.— තෝ කවර හෙයින් මෙහි පැමිණියෙහි ද?

දෙ. නි. — දේවයන් වහන්ස, සිංහල කෙල්ලක දෙමල තිලදූරියකු මරා ඇති බව සැල කරන්නට පැමිණියෙමි.

ගැ. — ඉතින්!

දෙ. නි. — ඉතින් දේවයන් වහන්ස, දෙමල වරිගයට මෙයට වඩා මදි කමක් කල හැකි ද?

ගැ.— එම්බල, දෙමල, තෙපි තව මැ නො දත්තනු යැ සිංහල කෙල්ලන් ගේ තරම!

දෙ. නි.— අවසර දේවයන් වහන්ස, මම හොඳින් මැ දනිමි. මේ දෙමල ඇඳුමෙන් ඔබ වහන්සේ ඉදිරියේ සිටින්නේ ඒ දෙමල තිල බලයට පහර දුන් සිංහල කෙල්ල තමා.

ගැ— මේ කියන්නේ ඇත්තෙක් ද? ඒ මුළු පුවත නො සඟවා කියනු.

දෙ. නි.— අසනු මැනැවි, දේවයන් වහන්ස, මා මහලු පියා සමඟ සිරි මහ බෝ සම්දුන් වඳින්නට අනුරාපුරයට ගියා. එහි දී— අප බෝ සම්දුන් වැඳා-පුදද්දී මැ එහි ආවා දෙමල තිලදූරියකු සිය මෙහෙකරුවකු ද සමඟ. තිලදූරියා ගේ අණ පරිදි මෙහෙකරුවා මා පියා ඇදැගෙනැ ගියා. කොහි දැ යි දන්නේ නැ. මා උපායෙන් දෙමල තිලදූරියා සිත් ගෙනැ ඌ හා ඌගේ නිවහනට යැමට පිටත් වුණා. අතර මඟ දී ඌගේ පමාවක් බලා ඌගේ මේ කඩුව ඇද මා ඌට කලයුත්ත කළා. ඉන් පසු ඌ ගේ මැ ඇඳුම් ඇඳැගෙනැ පැනැ ආවා. පියා හොයන්නට වත් නැවැතුණේ නැ. මා අසු වෙති යි වහා පැනැ ආවා.

ගැ.— මෙන් ඇදැහියැ හැක්කෙක් ද?

සෙබළෙක්— [පෙරට එමින්] දේවයන් වහන්ස මහලු මිනිසකු මෙහි සිටිනවා. ඔහු ගේ දුව හා අනුරාපුරයට ගිය ඔහු තනි වැ මැ එද්දී මට හමු වී මේ බදු මැ පුවතක් කීවා.

දෙ. නි. ඒ මගේ පියා වියැ හැකි.

ගැ— කෝ ඒ මහලු මිනිසා? මෙහි කැඳවනු.

[සෙබලා යෙයි]

ගැ— පින්වත් කෙල්ල, නී කල දේ ඇත්තෙක් නම් ඒ සිංහල ගැහැනු වගට ආඩම්බරයෙකි, සිංහල වූ අප හැමට මැ දිරි දනවන කරුණෙකි.

[සෙබලා මහල්ලා හා එයි]

මහල්ලා— දේවයන් වහන්ස!

ගැ—[තව මැත් සොලී වෙසින් සිටින තරුණිය අමතමින්] මේ ඔබ ගේ පියා ද?

තරුණිය-- දේවයන්වහන්ස, මගේ පියා මෙයට වඩා මහලු යි.

තා-- [මහල්ලා අමතා] මේ ඔබ ගේ දුව ද?

ම— [විමැසිලි බැල්මක් හෙළමින්] දේවයන් වහන්ස, මගේ දුව, මෙයට වඩා සුදු ගැනු ළමයෙක්!

ත-- දේවයන් වහන්ස, මා මෙයට වඩා සුදු තමා. දෙමළකු මෙන් පෙනෙන්නට මේ දූලි ගා-ගත්තා.

ම — දේවයන් වහන්ස, මා මෙයට වඩා මහලු තමා. තරුණයකු මෙන් පෙනෙන්නට මේ දූලි රවුළු බා-ගත්තා.

තරුණිය— [වහා ඉදිරියට පැන පියා වැලැඳ-ගෙන] මේ මගේ පියා! මේ මගේ පියා!

මහල්ලා —[බලවත් සතුටින් ඉපිලෙමින්] මේ මගේ දුව! සුදු දුව!

ගැමි ලියෝ නැමුමට සැරැසී එති; නටමින් මේ ගීය ගයති.

සැරදේ ලක් අම්මා
සැම සත වෙත නම්මා - ලා
සැරදේ ලක් අම්මා
ලෝ උයනේ දියුණුව මැදුරේ -
නිදහස් රන් යහනේ//
සොම්නස් මල් මාලා ගෙලැ ලා
පාමින් මිහිරි සිනා //
සැරදේ ලක් අම්මා
හැම සත වෙත නම්මා-ලා
සැරදේ ලක් අම්මා.

නිමි

ඔබ කිවියකු වීමට කැමැති ද?

එයට මඟ

අරිසෙන් අහුබුදුවන් ගේ

කවි පබඳ හදුරුව යි.

මසකට පැවුම් 4 කි.
අය කිරීම රු. 5.00 කි.

ගල්කිස්සේ,
හුළුදගොඩ පාරේ 20/1

ලක්දිවැ 'ගංගා, මහා ගංගා, මහා වාලුකා ගංගා හා කන්දර නදී' කවරේ ද? - 6

(ගිය කලයින්)

සිරිමල් රණවැල්ල

කණ්හ නදිය යන්න කළු හෝ හෙවත් කළු ඔය (කළු ගඟ) යනුවෙන් සිංහලයට නැගියැ හැකි නමුත් අනුරපුරයේ සිටැ රුහුණට එන්නකුට මුලින් මැ තරණය කරන්නට සිදු වන්නේ කලා ඔය බැවින් මෙහි කණ්හ නදිය නමින් හඳුන්වා ඇත්තේ කලා ඔය යැ යි සිතියැ හැකි. අනුරපුරයේ සිටැ රුහුණට ගිය සැම කෙනෙකුන් මැ පාහේ එසේ ගොස් ඇත්තේ තුඹහල්කඩුව, වඩමන්තොට හා දීගාවැව පසු කරමිනි.

එමෙන් මැ රුහුණේ සිටැ අනුරපුරයට ගිය සැම කෙනකුන් මැ පාහේ එසේ ගොස් ඇත්තේ දීගාවැව හා වඩමන්තොට පසු කරමිනි[52] අනුරපුරයේ සිටැ රුහුණට ගිය කිසිවකුට දක්ෂිණ දේශය කරා එසේ ගිය බවට කිසි මැ සාධකයක් මෙතෙක් ලැබී නැති. එ බැවින් යුවරජු හා ආදිපාදයන් ද රුහුණට පලායන්නට ඇත්තේ දීගා වැව කරා බැවින් ඔවුනට තරණය කරන්නට සිදු වූ නදිය කළු ගඟ යැ යි සිතියැ නොහැකි යැ.

කලා වැව හැඳින්වීම සඳහා චූලවංසය යොදා ඇත්තේ කාලවාපි යන වචනය යි.[53] කාල හා කණ්හ යන වචන දෙකෙ මැ ඇත්තේ එක මැ තේරුමක් බැවින් කණ්හ නදී යන්න මෙහි යොදා ඇත්තේ 'කලා ඔය' හැඳින්වීමට බව සිතීමට ඉඩ ඇති. කලා ඔය ගලා ගෙනැ යන්නේ කලාගම් පළාත මැදිනි. කලා වැව පිහිටා ඇත්තේ ද කලාගම් පළාතේ යැ. කලා වැවෙන් බටහිර කොටසට කලා ඔය යැ යි නම ලැබුණේ ඒ හරියේ දී ගඟ ගලායන්නේ කලාගම මැදින් වීම නිසා වියැ හැකි. උපරජු හා ආදිපාදියන් ගඟින් එ තෙර වන්නට ඇත්තේ කලා ඔයේ මේ කොටසේ යම් කිසි තැනෙකින් යැ යි අඩමාන කළ හැකි. අනුරපුරය ජය ගැනීම සඳහා රුහුණු මාගම සිටැ පැමිණි දුටුගැමුණු රජු අනුරපුරයට යෑම සඳහා ගඟ තරණය කෙළේ විජිතපුරයට දකුණින් කලාබලලු වැවට නුදුරු ස්ථානයෙකිනි.[54] සමහර විටැ උපරජු හා ආදිපාදයන් ද කලා ඔය තරණය කරන්නට ඇත්තේ කලාබලලු වැවට නුදුරු ස්ථානයෙකින් යැ යි සිතීම යුක්තියුක්ත යැ.

ද්‍රවිඩයනට බියේ රුහුණට පලා ආ ධාතුසේන කුමාරයාට ගෝණ නදියෙන් එ තෙර වන්නට සිදු වූ බව කියැවේ.[55] ධාතුසේන කුමරු රුහුණට පැනැගියේ මිරිස්ගෝනි ඔය හන්දිය අසලැ දී දඹුලු ඔයේ අතුගංගාවක් වන මිරිස්ගෝනි ඔය තරණය කොටැ බවත් මෑතක් වන තුරු මැ මිරිස්ගෝනි ඔය ගැමියන් විසින් හඳුන්වනු ලැබුයේ ගෝණ ඔය නමින් බවත් කියනා ජන ප්‍රවාදයෙක් දඹුල්ල අවටැ ගම්වලැ වසන ගැමියන් අතර පවතී. දඹුලු ඔය කලා ඔයේ ප්‍රධාන ශාඛාවෙකි. මේ අනුවැ පෙනී යන්නේ කලා ඔයේ අතු ගංගාවක් වන මිරිස්ගෝනි ඔය අනුරපුර යුගයේ අවසන් සමයේ ගෝණ ඔය නමින් හඳුන්වා ඇති බව යි.

අනුරපුර යුගයේ අවසන් හරියේ දී කලා ඔය 'ගංගා' යන නමින් හඳුන්වා නැතත් 'ගංගා' යන්න ඒ යුගයේ දී අමුත් ගඟ හැඳින්වීමට යොදාගෙනැ ඇති බවට සාධක ඇති. මේ පිළිබඳ වැ සාධක වැඩි හරියක් මැ ලැබෙන්නේ චූලවංසයේ ප්‍රථම භාගයෙනි. චූලවංසයේ මේ කොටසේ ඒ ඒ පරිච්ඡේද ලියැවුණු කාලය පිළිබඳ මතභේද කිහිපයෙක් ඇති. මහාසේන රජුගේ පුත්‍රයා වූ සිරිමේඝවණ්ණ රජුගේ කාලයේ සිටැ පළමු වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ අවසානය දක්වා වූ කොටස ධම්කිර්ති නම් හිමි නමක් විසින් දහ තුන් වැනි සියවසේ පමණ ලියන ලද යි ගෛගර් පඬිතුමා කියතත්[56] ඒ මතය පිළිගැනීමට තරම් සාධක

ලැබී නැති. සිරිමේඝවණ්ණ රජු ගේ කාලයේ සිට අනුරාධපුර යුගයේ අවසාන දක්වා ඉතිහාසය ඇතුළත් කොටස අනුරාධපුර යුගයේ අවසානයේ දී මැ – එ නම් ක්‍රි. ව. එකොළොස් වැනි සියවසේ දී පමණේ දී — ලියන ලද බවත් එ තැන් සිට පළමු වැනි පරාක්‍රමබාහු රජු ගේ රාජ්‍ය කාලයේ අවසානය දක්වා වූ කොටස දා තුන් වැනි සිය වසේ දී පමණ ලියන ලද බවත් තවත් මතයෙකි.[57] සිරිමේඝවණ්ණ රජු ගේ කාලයේ සිට අනුරාධපුරයේ අවසාන පාලකයා වූ පස් වැනි මිහිඳු රජු ගේ කාලය දක්වා ඉතිහාසය එක් ආචාර්යවරයකු විසිනුත් එ තැන් සිට පළමු වැනි ජයබාහු රජු ගේ රාජ්‍ය කාලයේ අවසානය දක්වා ඉතිහාසය තවත් ආචාර්ය වරයකු විසිනුත් එ තැන් සිට පළමු වැනි පරාක්‍රමබාහු රජු ගේ රාජ්‍ය කාලය තෙක් ඉතිහාසය එක මැ ආචාර්ය පරම්පරාවෙක ආචාර්යවරුන් කිහිප දෙනකුන් විසිනුත් ලියන ලදැයි තවත් මතයකි.[58] 'ගංගා' යන්න හා මහාගංගා යන්න චූලවංසයේ මුල් කොටසේ මුල් පරිච්ඡෙද කිහිපයේ යොදා ඇත්තේ අඹන් ගඟ හැඳින්වීමට බව පෙනෙන නිසාත් චූලවංසයේ මුල් කොටසේ මුල් පරිච්ඡේද කිහිපයේ මහාවාලුකා ගංගා යන නම යොදා ඇත්තේ මහවැලි ගඟ හැඳින්වීමට බව පෙනෙන නිසාත් යටත් පිරිසෙයින් චූලවංසය ආචාර්යවරයන් දෙ දෙනකු විසින් ලියන ලද බව කියන මතය පිළිගත හැකි යැ. අනුරාධපුර යුගයේ අවසාන කොටසෙහි ඉතිහාසය ලියූ කතුවරයා 'ගංගා' යන්න යොදා ඇත්තේ කුමන ගංගාවක් හැඳින්වීමට දැ යි සොයා බැලීම සඳහා ඒ කොටසෙහි 'ගංගා' යන නාමය යෙදුණු තැන් කිහිපයක් අපි මීළඟට පරීක්ෂා කොට බලමු.

මිත්සෙන් රජු (432-433) අනුරාධපුරයේ රජ කළ කාලයේ දී පණ්ඩු නම් දෙමළකු පරතෙරින් අවුත් මිත්සෙන් රජු හා යුද්ධ කොට රජු මරා රාජ්‍යය ගෙන ලක්දිව රජය කැරූ බවත් එ කල සියලු කුලීනයන් මැ රුහුණට ගිය බවත් දෙමළුන් ගඟින් මෙ තෙර (ඔරගංගාය) අදිපති කම් කළ බවත් චූලවංසයෙහි සඳහන් වෙයි.[59] මේ යුගයේ දී කලා ඔයේ එක් එක් ශාඛා කාණ්හ නදී, ගෝණ නදී, ආදී නම්වලින් හඳුන්වා ඇති බව පෙනෙන හෙයින් මෙහි 'ගංගා' යන්නෙන් අදහස් කළේ, කලා ඔය යැ යි ගත නොහැකි යැ. රුහුණු රට හා රජ රට වෙන් කළ මායිමක් වශයෙන් මහවැලි ගඟ යොදාගත් බව පෙනෙන්නේ අනුරාධපුර යුගයේ අවසන්භාගයේ දී හෝ පොළොන්නරු යුගයේ ආරම්භයේ දී හෝ බැවින් මෙ තැන 'ඔරගංගා' යන්න යොදා ඇත්තේ 'මහවැලි මෙ තෙර' යන අදහස දීමට යැ යි ද සිතිය නොහැකි යැ. පණ්ඩු රජුට ලංකාවේ කවර ප්‍රදේශයක් අයත් වැ පැවතියේ දැ යි චූලවංසය දක්වා නැතත් අපට මේ අනුව සිතා ගත හැක්කේ දක්ෂිණ දේශයත් රෝහණ රාජ්‍යයට අයත් වැ පැවැති බව පෙනෙන පාචීනදෙශයත් රජරටත් ඔහු ගේ යටතට පත් වූ බව යි. දුටුගැමුණු රජු මාගම රජු වශයෙන් පත් වී සිටි කාලයේ දී කඩොළැතු පාචීනදෙශයට (පාචිනපස්සයට) පලාගිය බව කියන පුවතෙක් සහස්සවත්ථුප්පකරණයේ එයි.[60]

මාගම් පුරය පිහිටා තුබුණේ අඹන් ගඟට නුදුරු වැ ඊට දකුණින් ඇලහැර ප්‍රදේශයේ බව අප වෙත ලිපියෙකින් පෙන්වා දී ඇති.[61] මේ සාධක අනුව සිතාගත හැක්කේ අඹන් ගඟ පාචීනදෙශයේ දකුණු සීමාව වශයෙන් පැවැති බව යි. එ බැවින් චූලවංසය මෙ තැන 'ඔරගංගා' යන්න යොදා ඇත්තේ 'අඹන්ගඟින් මෙ තෙර' යන්න හැඟැවීමට බව අනුමාන කළ හැකි යැ.

51 මව. LIII. 14–20
52 රස. පි. 149–152, 153–155, 165–167, 218; සහස්සවත්ථුප්පකරණං [සහ] අග්ග මහා පණ්ඩිත බුද්ධදත්ත ථෙර [1959] පි. 104–107
53 මව. XXXVIII. 42, 53, 92; 54 ලෙස අංක 2 පි. 76–80; 55 මව. XXXVIII. 22–26
56 Culavamsa Text (CV) (PTS) 1925) Vol. I p. iii
57 අනුරාධපුර යුගය ලියනගමගේ ගුණවර්ධන (1961) පි. 10
58 සිංහල මහාවංශය [සිමව] ද්විතීය භාගය සුමංගල නායක මාහිමි බටුවන්තුඩාවේ දෙවරක්ෂිත පඩිතුමා [1954] පි. IV–V
59 මව. XXXIVII. 11-I2 60 සහ පි. 49 61 සාරද පි. 137–146

දළ සළ කුමරු ගෙ සැරය - 4

පළ කැරුම - උණවටුනේ හේලි පහරුව

මිල රු. 2.50 යි.

දූතව සිංහලයෙහි ලැබෙන ඈදි මැ අසුන් කව මේ වෙයි. ලියැවුණේ පළමු වැනි අග්බෝ රජු දවසැ විසූ දෙළොස් මහ කිවියන් අතරැ වූ දළ සළ කුමරුන් විසින් බව කව මැ පවසයි.* සැරයක් (ඊයක්) දූත කිරියෙහි යොදැ අනුරාපුරේ සිටැ කතරගමැ දෙවොලට යැවෙන අයුරින් කැරිණි.[1] අබාගිරි වෙහෙරැ මහානම් නම් දුසිල් පැවිද්දකු දෙසට ලක් කොටැ, තෙර වාද බුදු දහම රැකැගැනුම අස්හේ අදහස යි.

කව පැදි 67 කින් යුතු යැ. සැකෙවි අරුතත් ඉංගිරිසි පෙරළියත් සමඟ දිගට පළ වෙයි මෙ කව.]

11 සුර් අතෙ එක් අසිපත් දුරැ
සුමන සෙනෙවි බමගත් වරැ
දසතින'වුද් ඉහි මෙ පැහැරැ
එහු බල පැ වටහි වැතිරැ-

අරුත— සුර් අතෙ (සුරතෙහි) එක් අසි පත් (කඩුව) දුරැ (දරා) සුමන (වේ-ළු සුමන) සෙනෙවි බම (බිමුම්) ගත් වරෙ (වරැ) අස අතින් අවුද් (අවුත්) ඉහි (එහි-ඒ කඩුවෙහි) පැහැරැ (වැදී) වටහි (අවටැ) වැතිරැ, එහු (ඔහු ගේ බල (බලය) පැ (පෙන්නු) -[සැරය]

පෙරළිය-The Arrow that fell at the foot of the warrior Sumana (Velusumana) having struck against his sword, as he whirled it in his right hand (to ward off the many arrows that came from all ten directions)- thus exhibiting his prowess to the world.. ......

12 පුද් වනු රිසි එ හැම නොරිසි
ලොව් මෙත් ගත් එද් හිද් ගත්
දූමියන් අතැහිද් කෙළි පත්
සැරය ත-හට මෙද් වෙයි නිසි

අරුත— පුද් (පුද) වනු (වදිනු) රිසි [වූ] [එහෙත්] එ (ඒ පුද) හැම නොරිසි [වූ], ලොව් (ලෝ වැස්සන් ගේ) මෙත් (මෙත) ගත් (හමා වෙතට ගත්) එ ද් (ඒ මෙත) හිද් (සිතට) ගත් දූමියන් (ගුරුළු දූමියන් ගේ) අතැහිද් (අතෙහි ද) කෙළි පත් (කෙළියට පැමිණි) සැරය, ත-හට (තා හට) මෙ ද් (මේ කාරිය ද) නිසි වෙයි.

පෙරළිය-- The Arrow, that danced in the hands of Gurulugomi, who won the compassion of the world, thus filling his heart with it;— Gurulugomi, towards whom the gift- offerings of the world, would fain come, but who did not wish to have them!

3. නික්මුම

13 සුවණ් නකත්
අල්ලෙයි එත්
දුරැ මෙය් පත්
යාගත් සෙද්

අරුත— සුවණ් (සුවණ) නකත් (නැකැත) අල්ලෙයි (හෙට) එත් (එන විටැ) මෙය් (මේ) පත් දුරැ (දරා) සෙද් (සෙද;වහා) යාගත් (ගමන් ගත්තැ.)

පෙරළිය— At the appearance of the auspicious constellation - the Suvana Nekata - which takes place tomorrow fly away with this Message, O, arrow.

*දළ තොද්නි වත් හිර් — ළ විමන් කුලුණ් මැණෙන'ලු
සළ සෙ තොද් සල ගත් — ලක්හි එක් සෙ සත් ලැගු
ඥාණල තිරින්දු අග්බොයි — ළෙහි ලෙව් ලැ ස-වස්නිති
මෙ ද දම් රක්න වස් — දළ සළ කුමර් ලැහා. (61,62)

මගේ බලපිටි සමය - 6

කුමරතුඟ මුනිදසුන් බළපිටියේ ගුරු ඇබෑසි විදුහල් පති වැ විසූ සෙමෙහි එ විදුහල්හි පුහුණුව ලද ගුරු ලකෙණකුන් සපයන මෙ ලිපි පෙළෙන් මුනිදසුන් පිළිබඳ රසවත් පුවත් රැසක් ද හෙළි වනු ඇති.

මොහොට්ටි දෙණු දේවිදු

එදා පස් වරුයෙහි නියම වේලාවට පැමිණියැ යුතු හැම දෙන මැ වාගේ රැගෙනැ ආ යුතු සියලු දෑත් රැගෙනැ විදුහල් බිමට සැපත් වූ හ. ඇතැමෙක් අපට කලින් පැමිණැ සිටිය හ. අප ගිය පසු ද ආ හ ඇතැමෙක්. තව මැත් එති සමහරෙක්.

විදුහල් පති කුමාරතුංග මුනිදසයන් පැමිණියේ ද අප ගිහාට පසු වැ යැ. අප එක් වැ ගිය සිවු දෙනා ගෙන් දික්වැල්ලෙන් පැමිණි දෙ දෙන මුනිදසයනට නෑ-සබඳ කම් ඇත්තෝ වූ හ. ඒ දෙ දෙනා ගෙනුදු වැඩි මහල් තැනැත්තා ගැනැ පැමිණි ඔවුන් ගේ දනැ-හැඳුනුම් කම් ඇත්තෝ.

දැන් වේලාව පස් වරු හය හමාරට පමණ ඇති. එ හෙත් විදුහල පිහිටියේ වෙරළ අසබඩැ මැ හෙයින් දවල් මෙන් එළිය තව මැ පවතී. කුමාරතුංග මුනිදසයෝ අප සිවු දෙනා සමඟ වෙරළට සෙමෙන් සෙමෙන් ඇදෙමින්, දික්වැල්ලේ තොරතුරු, නෑ - දයත් ගේ සුව දුක් ඈ පවත් අර ඔවුන් දන්නා හඳුනන තැනැත්තහු ගෙන් විමැසූ හ. හෙ ද සැකෙවින් පිළිතුරු සැපැයී. එසේ මැ ආ අප දෙ දෙනා ගැනැ ද තොරතුරු විමැසූ හ. ඉක්බිති අප ගේ ගම රන්සෑගොඩ බව මම කීමි. රන්සෑගොඩට මාතර සිටැ කවර පාරෙකැ කො තරම් දුර යා යුතු දැ යි ඇසූ හ. හක්මන පාරේ ගොස් තිහගොඩැ දී අතුරු පාරකට හැරී ගිය කලැ මාතර සිටැ තුදුස් මයිලයක් ඈතින් එය පිහිටි බව මම පැවැසීමි. අතුරු පාරෙකැත් යා යුතු දැ යි අසමින් කුමරතුංගයෝ පොල් තුරු මුදුන් වෙතැ නෙත් රස් යැවූ හ. ඒ වටහාගත් මඹ, ඒ පාරවල් හුරු අය එහි නැති බව පැවැසූ විටැ සිතා පහළ කළ හ ඔහු.

අප පස් දෙන මැ දැන් ඇදෙනුයේ මුහුදට පිටු පා විදුහල දෙසට යැ. උගැන්මේ කටයුතු කිරීම සඳහා යුදුසු අත්දමේ ගොඩනැගිලි තව මැ කතා නිම නැති. එ මැ ගොඩනැගිලි සාද නිමවන තුරු 'රේගුවේ' ගොඩනැගිලි මැ ඒ සඳහා යෙදීමට කටයුතු පිළියෙළ කරන ලද් යැ. ලැගුම් හලකට ගත යුතු ගොඩ නැගිල්ලෙකැ ගෙ බිම මේ වන තුරුත් කිහිප දෙනෙක් සෝදමින් සිටිය හ අපි ඒ ගොඩ නැගිල්ලට ඇතුළු වූමූ. එහි බිම සෝදන්නෝ අප ගේ පිරිසුම් විබෙදුවටත් දෙ මසකට පමණ පෙරැ සිටැ විදුහල ඇරැඹුමට මෙන් උගනිමින් සිටි දස දෙළොස් දෙනා යැ. ඔවුන් ගෙන් එකෙක් කුමාරතුංගයන් හොඳට හඳුනන්-නෙකි. නිවිටඹුවේ ඇබෑසි විදුහලට ඇතුළු වී එහි පුහුණු වෙමින් සිටි බව ද, කුමාරතුංගයන් වෙතැ පුහුණු වීම එ තරම් පහසු බවක් නො-පෙනුණෙන්, කිසියම් කරුණක් නිසා නොබෝ දවසෙකින් මැ නිවිටිඹුවෙන් පලා ආ බව ද, රොබට් ද සොයිසා සූරීන් හඳුනන හෙයින් බළපිටියේ විදුහල පටන් ගන්නා අවදියේ මැ ඇතුළුවැ සිටි බව ද, වාසනාවකට හෝ අවා-සනාවකට හෝ නැවැතැ දු කුමාරතුංගයන් මැ හමු වූ බව ද පසු වැ අපි ඔහු ගෙන් අසා දැනැගතුමූ.

කුමාරතුංගයෝ, ඔහු දුටු සැටියේ මැ, 'හා! මුත්තැහේ දැන් මෙහි ද?'යි ඇසූ හ. "ඔව්, මා නිවිටඹුවෙන් ආ දවස්වලැ දී මැ වාගේ මෙහි එන්නට කටයුතු පිළියෙළ කැරැ-ගත්තා' යැ යි හෙ එක් වරට මැ පිළිතුරු දී තමා කරමින් සිටි කටයුත්ත මඳකට නවතා, ඔහුට හොඳට පුරුදු කුමාරතුංගයන් ගේ මුහුණ දෙසූ බැලී යැ. ඔය වැඩි වුව ද මෙ සා හොඳින් කඩිසර වැ නරතුයේ නිවිටඹුවේ සිටි ඒ සුළු

කාලයේ අනුහසින් නො වේ දැ යි කුමාරතුංග-යෝ පිළිවිසූ හ. හෙ තෙම ඒ අනුමාන කළාක් මෙන් නිහඬව මැ සිටැ කමං කළ කටයුත්ත මැ කිරීමට යළි දු පටන් ගති.

මෙ මැ ගොඩනැගිල්ල තුළැ මසූරිකා ලෙඩුන් මෙ මෑතක් වන තුරු රජය මගින් නවතා සිටි හෙයින් එහි බිම දෙ තුන් වරක් හොඳට සේදූ බව සෝදුවන් ගෙන් දැනැ ගතුමු. මේ හැර තව ද ගොඩනැගිලි දෙකෙකි. සියල්ල සවිමත් වැ නිමවා හුනු පිරියමින් බිත්ති නිමහම් ලද තරමක් පැරණි ගොඩනැගිලි යැ. ඉතා මෑතැ දී උළු මාරු කිරීම ආදි-යෙන් අලුත් වැඩියා කළ බවෙක් ද පෙනිණ.

මෙහි සැසි නිවෙස් බාර වැ සිටියෝ (A. D. S.) කරුණානායකයෝ යැ. ඇතුළු වත්තවුන් ගේ ගණනට සෑහෙන තරම් ගණනක් ය-කඩ ඇඳ රොබත් ද සොයිසා සූරීන් විසින් කොළොඹින් රැගෙනැ එවුණු බව ඔහු කී හ. කුමාරතුංගයන් සමග දූත් ඒ හැම ඇඳ මැ තිදන හල් තුළට යෙයි. විදුහලට ඇතුළු වූවන් ගේ නම්වර අනුවැ, ඇඳ දෙකක් අතර සුදුසු තරම් ඉඩ දී, හල මැද අඩි තුනක් පමණ වූ පාරකුදු සාදා ඇඳ දෙ පෙළක් වැ සැදී එහි ඉතිරි සියලු ඉඩ කමින් දැකුම්කලු පරිදි පැතිරෙයි. එක් වැ ආ අපි සිවු දෙන අප ගේ නම්වර ඇති ඒ ඒ ඇඳ වෙතැ ගියමු. ඇඳුම් පෙට්ටි ද ඇඳ යටට යැවූමු. සෙස්සෝ ද එ සේ මැ කළ හ. අප සතර දෙනා ගෙන් මම ද, අනෙකෙක් ද එක් ළඟැ මැ දෙ ඇඳෙකැ වූමු. ම-ගේ නම්වර සතර යැ. අනෙකා පස් වැනි නම්වර ලද්දේ යැ. සෙසු දෙ දෙන අනෙක් හලෙකැ යා නොවන දෙ තැනකට ගිය හ.

සියලු ඇඳ ඒ ඒ තැන් ගනුත් මැ විදිලි එළිය ද ආයේ යැ. ඒ ලබා දෙන යතුරෙක් විදුහලට වෙසෙසින් සැපැයුණේ ල, රොබත් ද සොයිසා සූරීන් විසින්. දූත් සැසි නිවෙස් ඇතුළු ඉමහහර යැ. සියලු ඇඳ සුදු වතින් වැසුණේ යැ. ඊට මැ සරි ලන සුදු උරයෙකින් වැසුණු කොට්ටය බැගින් පැමිණැ ඒ ඒ ඇඳේ ඉස්දෙර සරසා සිටියේ යැ. සියලු මැ බිත්ති සුදෝසුදු යැ. අපි හැම දෙන මැත් සුදු වතින් සැරැසුණෝ වූමු. ඊ පිටට විදිලි එළිය වැටුණු කලැ කො තරම් දැකුම්කලු ද යනු සලකා ගත හැකි යැ.

දූත් හැම දෙන මැ තම-තමන් ගේ ඇඳෙහි හිඳිති. ඇඳෙන සේ සකස් කළ කම්බියෙන් වියා ඇති හෙයින් හිඳැ-ගැන්මේ දී සුළු ලෙස පැද්දෙන ගතියෙක් දැනේ. එ බඳු ඇඳට මෙට්ට යක් ඇවැසි වුව ද තව මැ ඒ නොසැපැයුණේ යැ. අනෙක් හැම ඇඳක් මැ කම්බි ඇදූ සකසා තුබුණත් මට ලැබුණු ඇඳේ කම්බි වෙනුවට තුබුණේ අඟලක් පමණ පළල ආනී යකඩ පටි යැ ඒ යකඩ පටි දැනට ඇදූ හොඳට වියා තුබුණේ යැ. එ බැවින් එහි අනෙක් ඇඳෙකැ මෙන් පැද්දෙන සුවය මට නොලැබුණ ද මෙට්ටය නැති පාඩුව එ සා තදින් නොදැනුණේ යැ. එහින් ලැබෙනුයේ ලැල්ලෙකැ වැතුරුණු කලෙකැ මෙන් ඇහට ලැබෙන සුවය යි.

දූත් වේලාව රෑ අටට පමණ ඇති. මෙයට හෝරා බාගයකට පමණ කලින් කුමාරතුංග මුනිඳුසයෝ රොබත් ද සොයිසා සූරීන් ගේ මැඳුරැ බලා ගිය හ. එ දිනැ රෑ ඔහු එහි ගත කළ හ. සැසි නිවෙස බාර කරුණානායක-යන් ගේ අණ පරිදි, එකෙක් තළාව පිඹියේ යැ. රෑ අහර ගැන්ම සඳහා යැ ඒ. ගෙල දක්වා වැසුණු කබ යෙන් සැරැසී අත් පිස්නාවක් ද, හැඳි ගැරුප්පු ද අතැති වැ එන ලෙස ගේ අනෙක් අයට දැන්වී යැ. අපි හැම දෙන මැ ඒ අණෙහි පිහිටා එ සේ මැ සැරැසී බොජුන හල කරා ගොස් තිබි පරිදි අහර ගෙනැ පෙරළා යහන් ගබ කරා ඇදුණමු.

[එන කලබව යෙයි]

× × ×

'විද්වාංනෙ'ව විජානාති විද්වද්ජන පරිශ්‍රමම්'

[විදු දන පිරිසරම—දන්නේ විදු දන මැ වෙයි.]

ගුත්තිල ලකර

(සරසවි පිවිසුම් පෙළ සඳහා යැ.)

සඳදස් කෝපරහේවා

ලකර හෙවත් අලංකාර යනුවෙන් අදහස් කැරෙන්නේ කිමෙක් ද? සිත්තරෙක්, සිත්තමක් සැරසීම සඳහා එහි පැහැය වැඩි කරයි, නො එසේ නම්, අඩු කරයි. ඔහු විසින් ඇඳුණු රූපය, ඉස්මතු කරනු සඳහා පසු-තලය අඳුරු හෝ එළිය හෝ කරයි. ඒ රූවේ ඇතැම් කොටත් උලුප්පා පෙන්නයි. එය, ලොකු කොටැ හෝ කුඩා කොටැ හෝ දක්වයි. හෙලු සිත්තම් ආමෙර් මේ උලුප්පා පෙන්නිමක්, වෙනස් කිරීමක් දැකියැ හැකි යැ. අත්තාසි මල් රටා, නෙළුම් මල් රටා ආදියෙහි මෙය වැඩියක් මැ පැහැදිලි වැ පෙනේ.

අපි ද අපේ සිරුරු එ වැනි අයුරෙකින් මැ සරසමූ ඇගේ අඟරා ආදිය ද, මුහුණේ වත් සුනු ආදිය ද තවරමූ. ගැහැනු ඔවුන් ගේ කෙස් වැටි මලින් සරසති; එසේ සැත් නම කෙස් වැටිය නොයෙක් රටා විදි අනුවැ සක-සති. නගරවලැ, ඇතැම් ගැහැනු ඔවුන් ගේ නිය ද, තොල් ද මුහුණ ද නොයෙක් විදියෙන් සරසති.

සොබා දහම විමසන විටැ, මේ සැරසුම් නොයෙක් ලෙසින් දැකියැ හැකි යැ. ඉතා කුඩා සතුන් ගොදුරට ගන්නා ඇතැම් මල්, පැහැ-යෙන් ද සුවඳින් ද සෑදි ලකර (අලංකාර) පාමින් සිටී. පොදුවේ සලකා බලන විටැ, මුළු-මහත් ලොව මැ අමුතු අමුතු සැටියෙන් සැරසෙන බව ඔබට පෙනෙනු ඇති.

ගුත්තිලයේ ඇතැම් පැදී ද නොයෙක් විදියේ අලංකාරවලින් සැදී ඇති. ඒ හැම දක්වන්නට මේ නොහැකි. පොදුවේ සලකන කල්හි, එය මෙසේ බෙදියැ හැකි යැ:—

- i අතිශයනාලංකාරය,
- ii උපමාලංකාරය,
- iii රූපකාලංකාරය,
- iv සහෝක්ති අලංකාරය,
- v වක්‍රාලංකාරය,
- vi පර්යායෝක්ති අලංකාරය,
- vii ශබ්දාලංකාරය (අනුප්‍රාස - යමක ආ)

i ඇති විය හැකි පමණ ද ඉක්මවා, යම් වැනුමක් කරන විටැ, එ තැනැ අතිශයනා-ලංකාරය වෙයි.

(96) දුළ සිසි කිරණ පට
මිණි කොත් ඇණින් අසු කොට
තැබුවෙ'ව පුර'ලු කොට
පිදි පල එහි දිලෙයි හැම විට

දිලිසෙන්නා වූ සඳ රැස් පිළිය. මැණික් කොත් නමැති ඇණවලින් අවුණා, හැම විටැ, එළිය ඇති වන පරිදි, රඳවා තැබූ සේ, පුරයේ පිදී ගෙ පියසි බබළයි.

ii යම් කිසිවක් ඒ හා සමාන තවත් දෙයකට උපමා කොටැ දක්වීමෙන් කැරෙන අලං-කාරය උපමාලංකාරය නම්.

(95) මිණි බිමැ දිසි දිමුත්
පහගැ ලෙළ දෙන දද යුත්
වැදූ සිඳු සපුන් ගත්
ගුරුළු දහසෙව දන නුවන් ගත්.

කාන්තිමත් මැණික් බිමේ පෙනෙන, මුදුනේ ලෙලෙ දෙන කොඩි ඇති මහ මැඳුරු මුහුදු වැදූ නයින් ඇදගත් දහස් ගණන් ගුරුළු රැස සේ දනන් ගේ නෙත් ඇදගනී. මෙහි ලෙලෙ දෙන කොඩි ගුරුළුනට සමාන කොටැ ඇති.

iii සමාන කරන දෙයින් මුල් දෙයට අප්‍රධාන තැන ද, මුල් නොවන දෙයට ප්‍රධාන තැන ද දීමෙන් කරනු ලබන අලංකාරය රූපකාලංකාර යි.

(106) ලෙළ දෙන තන'වි සිළු
රෙද දුම් කඳින් පිහිකුළු
ඔහු සෙන් ලැවග රළු
කෙළෙළ් මොළ රුපු නිරිඳු මුළු අළු

සේනාවේ ලෙළ දෙන ආයුද ගිනි දැල් මෙන් ද, නැංවෙන දූලි, එය වසා සිටුනා දුම් කඳ මෙන් ද, රජු ගේ සේනාව ලැව් ගින්නක් මෙන් ද දැක්වුණු සැටි බලන්නැ.

iv වෙන් කොට කිව යුතු පෝරුම් දෙකක් සහ යන නිපාතයෙන් හෝ, එයට සමාන අනෙකක් යෙදීමෙන් හෝ එක් කොට විසිතුරු අරුතක් පළ කරනුයේ සහෝක්ති අලංකාර නම්.

(105) යුදෙහි ඔහු, කග ලිය
සමඟ රුපුනා'ද වෙවිලිය
උන'ඹු සිතැ විළි ලිය
සමඟ ඔහු යස ලිය ද ලියලිය.

සටනේ දී මේ රජු ගේ අතේ ඇති කඩුව වෙවුලා ගියේ යැ. ඒ සමඟ මැ සතුරන් ගේ සිත ද වෙවුලා-ගියේ යැ. එයින් ඔවුන් ගේ අඹුවන් ගේ සිතේ ලජ්ජාව නමැති වැල ද ලියලන්නට වියැ. ඒ හා මැ, රජු ගේ කීර්තිය නමැති වැල ද ලියලන්නට වියැ.

v පබඳේ හෝ වැකියේ හෝ වස්තුව පිළිබඳ වැ ඇති වන අලංකාරය වස්තවලංකාරය යි. යමක් ඒ වූ සැටියෙන් මැ—සැටියම් (Realism) අනුවැ මැ — හැඳින්වෙන කල්හි, මේ අලංකාරය වේ; යමක් සොබාහුරු වැ හැඳින්වීම යැ. යමක් කියූ පමණින්, මේ අසුවල් දෙය යැ යි, කෙනකුට වැටැහේ නම්, එහි ද මේ අලංකාරය වෙයි. සුරා මතින් සටන්නා මෙහි ඇස් හමුයේ මැවී පෙනේ.

රැගත් සුරා පිරූ මතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නො දනැ බමන ගතින්
නටන් අයෙක් සුරා මතින්

iv කියැ යුතු අරුත එයට සමාන වූ, වෙන අරුතෙකින් අඟවා නම්, එයින් වනුයේ පර්යායෝක්ති අලංකාරය යැ.

ගින්නෙන් නැඟුණු දුම්
දවන හොත් වැදූ මහ දුම්
එ මැ ගිනි කඳ එ දුම්
කුමැ යි නො දවා ද ලද විහිදුම්

vii 'ශබ්දලංකාරය' වැකියේ අකුරු හඬ සබඳින් යෙදෙන්නෙකි. එය අනුපැහැසිය යනුයෙන් හැඳින්වේ. අනුවැ හැපීම—පැහැසීම යනු එහි පෝරුම යි. "ස්වරය අසමාන වුව ද ව්‍යඤ්ජන ශබ්දයා ගේ සමාන බව වේ නම් එහි අනුප්‍රාසය වෙයි" යනු කුමරතුඟු මුනිදසුන් ඒ විහර කරන අයුරු යැ. වැඩි විතර ප්‍රබන්ධොපදෙශය බලා දත මැනැවි.

දුමන මුල් ඉදිරූ
ලවන ලොබ ලිය පදුරූ
එ වෙණ නද මියුරූ
සවන නොකරන කෙනෙක් කවුරු?

vi වන පැදියේ එන යමක ලකුණු ද 'න' හඬ 'ද' හඬ ආදියෙන් මතු වන අනුපැහැසිය ද විමසන්නැ.

vii වන පැදියේ එන 'දුමන මුල්' 'ලවන ලොබ ලිය' ඈ තැන් ද එයට දෙස් දේ.

(මතු සබඳි)

සිත නිදහස් බවට
නො පමුණුවා පලමු කොට
නිදහසට සිය රට
ලමු යි යෙති දදනු ඇතියෙන් කට

— කුමරතුඟු මුනිදස්

ලක් ඉතිහාසට රුකුල - 8

කමල් තිලක

ප්‍රාදේශීය පාලන සභා

1. 1871 දී ගම් සභාවල බල තල වැඩි කිරීමෙන් ඒවා ප්‍රාදේශීය ආංඩු බවට පෙරළිණි —> මං මාවත් පවත්වාගෙන යෑම ආදිය ද පාසල් පවත්වා ඒවාට ගමේ ළමයින් යන වග බලාගැන්ම

2. වතු වැවිලිවල දියුණුව නිසා වෙළෙඳාමේ දියුණුවෙක් විය —> නගරයේ ජනගහනය වැඩි විය —> සනීපය හා සෞඛ්‍ය රක්ෂණය පිළිබඳ බරපතල ප්‍රශ්න

ප්‍රාදේශීය සභා

කටයුතු

සෞඛ්‍ය රක්ෂණය, සනීපය, ආලෝකය සැපැයීම, පොලිස් සේවය, සොහොන් බිම් ආදිය ගැන බැලීම

3. වසූරිය හට ගැනිණි. ඒ බෝවීම වැලැක්වීම වස් 1853 දී ලෝකල් බෝඩ් ඇරැඹිණි.
4. 1865 නාගරික සභා පිහිටුවීමේ ආඥා පනත කොළොම්බ (1866); ගාල්ල (1867); මහනුවර (1866); යන නගරවල 'මියුනිසිපැලිටි' මහා නගර සභා පිහිටැවිණි.

'මියුනිසිපැලිටි'

ඡන්දයෙන් තෝරාගත් අය | නම් කරන ලද අය

සභා රැස්වීම්වල මූලසුනට සිවිල් නිලදරුවෙක්

කොළොඹට වෙන ම නිලදරුවෙක් | මහනුවර, ගාල්ල:- මධ්‍යම, දකුණු පළාත්හි ඒජන්ත

කොළොඹ

ඡන්දයෙන් තෝරා පත් කැරුණු 10 | නම් කැරුණු 9

ගාල්ල, මහනුවර

තෝරුණු 5 | නම් කැරුණු 4

කටයුතු - ප්‍රාදේශීය පාලනය

5. සෙසු ප්‍රධාන නගරවල ලෝකල් බෝඩ් ම විය.

ලෝකල් බෝඩ්

ඡන්දයෙන් තෝරුණු | නම් කැරුණු

සිවිල් නිලදරුවෙක් මූලසුනට

කුඩා නගර - සැනිටරි බෝඩ්.

ආංඩුවේ දෙපාර්තමේන්තුව

1. බ්‍රිතාන්‍ය පාලනයේ මුල් අවධියේ දෙපාර්තමේන්තු ස්වල්පයෙක් ඇති විය.

2. පැවැති ක්‍රමය

ආංඩුවේ ඒජන්ත — ප්‍රධාන පාලන නිලදරු

↓

සභාග නිලධාරීහු

කටයුතු: සිය දිස්ත්‍රික්කයේ සාමය රැකීම, ආදායම් එකතු කිරීම, වාරි ක්‍රම, ගොවිතැන් පිරික්සීම, අධ්‍යාවුල් බේරීම ආදිය.

එහෙත්: ජනගහනය වැඩි විය.
ප්‍රශ්න ද වැඩි විය.

3. කර්මාන්ත කටයුතුවල දී ශ්‍රමය යෙදීමෙ ඇඩ පිළිවෙළක් බ්‍රිතාන්‍යයේ සාර්ථක ලෙස කැරුණු හෙයින් පාලන ක්‍රමය පිළිබඳව ද එය ම අත් හද බැලීමට තැනෙක් විය. නොයෙක් කටයුතු අණෙඩුවේ විවිධ දෙපාරතමේන්තුවලට පැවැරිණි.

සමහර කටයුතුවලට විශව විද්‍යාලයීය උපාධි ලත් ඒජන්තවරුන් නොව ඒ විෂයය පිළිබඳ විශේෂඥයන් ඇවැසි බව පෙනිණි. ඒජන්ත — තම පෙදෙසේ දෙපාරත-මේන්තුවල කටයුතු එක්ලස් කරන්නට විය.

4. පොලිස් බල ඇණිය තර කිරීම
වෙන රටවල පලපුරුදු අයට තනතුරු දීම
ජේම්ස් කොන්දේසි වඩාත් ජනප්‍රිය වීම

5. 1900 රජ්ජේ ආංඩු කාරයා මිසින් වාරි මාර්ග දෙපාරතමේන්තුව පිහිටැවිණි.

ඇතැම් දෙපාරතමේන්තු පිළිසකර කිරීම හා නව දෙපාරතමේන්තු ඇති කිරීම සිදු විය.

6. පාලනය සාර්ථක කිරීමට මහා මාර්ග හා දුම්රිය මාර්ග උදව් විය.

අධිකරණය

1. 1831 -(කැමරන්) ප්‍රධාන නගර
↓
දිස්ත්‍රික්ක උසාවිය
සිවිල් නඩු | ක්‍රිමිනල් නඩු

2. 1844 පොලිස් උසාවි —> සුළු අපරාධ නඩු
3. 1848 රික්වෙස්ට් උසාවි – සුළු සිවිල් නඩු
4. රෝමානු ලන්දේසි නීතියේ අඩු පාඩු
   i වෙළෙඳාම වටා නටගත් ආරවුල් පිළිබඳ නීති නැති වීම
   ii 19 වැනි ශත වර්ෂයේ සානුකම්පාවාදය හා ඇතැම් නීති හා නොසැසැඳීම
5. 1885 නව අපරාධ නීති සංග්‍රහයක් වලංගු කැරිණි – කලින් කල සංශෝධනය විය,

මිතුරිය

මිතු රිය සොඳුරු මැවුමෙකි බඹ ගුණෙන්   නැමීන්
සිතු මා එකග වෙයි ඔබ වෙත පැමිණි   සැමින්
කිතු ලිය ලිය ලැවෙයි ඇසුරට බට   කරුණින්
මතු මැඩ පනා මම වෙහෙසෙමි ඔබ   සරණින්

අභිමන් සිදිය සත, කෙලෙසන සිරිත   සබේ
අභිසරුවියන් දූන් සරතුදු වෙසින්   ඔබේ
පිබිදුණු ම මිතුරි ගෙ මුව කැටපතින්   සුබේ
සැකි අදහස් දහස් දක්නට නිතර   ලැබේ

දද බව නමැති දදයෙහි කැසුමට දන   ගේ
සොඳ එක ඔසුව දන්නි යෙහෙළිය පැ   මගේ
හද ගත් නිබද ඔබ ඉන් මං අදර   ගගේ
දද තංවමින් පැදූ යන රන් නැවෙනැ   හැනේ

තිර සර මිතුරි ඔබ අන මට දෙනවා   ද
නරනට දිවි නදිය මතු, එක් වෙනවා   ද
බර මගෙ උසුලමින් මා නා වී   තාදු
හර බර ඉදිරියක් සලසනවා   නේද

අ. පොන්නම්පෙරුම

දූහුන පබඳ

අපේ දැය

කාලිංග විජයවර්ධන

අපේ දැය හෙළ දැය යි; සිංහල ජාතිය යි. ඒ ඉතා පැරණි ය. අද දියුණු යැ යි කියන බොහෝ රටවල්, බොහෝ ජාතීන් නොදියුණු කාලයේත් මේ රටේ අප දියුණුවෙන් දියුණුවට පත් වී සිටියා.

රෝමවරුන් ලතින් බසින් රජ කරද්දී අප හෙළ බසින් හෙළදිවේ රජ කළා. අද රෝම රජයන් නෑ. ලතින් බසත් මළ බසෙකි. එහෙත් අපේ බසත් අපේ දැයත් අදත් පවතිනවා. මේ, අපට ලොකු ආඩම්බරයෙකි.

අපේ දැයේ රුවණ, පඬු අබා, ගැමුණු, පැරකුම්, විජයබා, රාජසිංහ වැනි වීර රජුන් සිටියා. පංඩුල, ගුරුළු ගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි මහ පඬිවරුන් සිටියා. මහ මුහුදු වැනි වැව්, මහ කඳු වැනි දාගැබ් ඉදිකැරවූ මහ ඉදිකරුවන් සිටියා. ගහලයා ගේ කඩුවට බිය නැතිව බෙල්ල දුන් මද්දුම බංඩාර වැනි එඩිමත් ළමයිනුත් සිටියා. අනේ අපේ දැයේ එ දා තිබුණු උදාර ගතිය!

සමහරුන් කියනවා අපේ දැය පටන් ගත්තේ විජය ගෙන් ය කියා. මා දන්නා හැටියට විජය මහ පල් හොරෙකි. ඔහු ගේ මුත්තා තිරිසනෙකි. පියාත් ඔහු ගේ පියා මැරූ අසත්පුරුෂයෙකි. විජයත් මේ රටට අවුත් කෙළේ නොහැදුණු කම් ය. ඔහු ගෙන් අපේ ජාතිය පැවැතෙනවා ය කීම ගැන මට නම් ලැජ්ජා හිතෙනවා.

අපේ ගුරුතුමා අපට කියා දුන්නේ විජය මේ රටට ආ විදේශිකයකු—පරයකු — හැටියට යි. ඔහු ගේ පරපුර වනසා මේ රටේ හෙළයන් එකතු කළ පඬු අබා රජු ගෙන් අපට සිංහල නම ආ බව එ තුමා කීවා. සිංහල වූයේ මේ රටේ බොහෝ ඉස්සර සිට විසූ යක්, රකුස්, නාග, අසුර යන සිව් හෙළයන් ලු. එ සේ නම් අපේ දැයට කියන හෙළ නම අපට මහ ගරුවෙකි.

දැයේ ගරුව රැකෙන්නේ බසේ ගරුව රැකීමෙනි. බසේ ගරුව රැකීමට නම් එය හොඳින් ඉගෙන ඉන් වැඩ කළ යුතු ය. බස කෙලෙසන්නෝ දැයේ හතුරෝ ය.

හූනා ගේ කතාව

රෝ. ල. රාජකරුණා

අපේ ලොකු අයියා කිඹුලා යි. ඔහුට ගොඩ බිම එපා වී දියට ගියා. කබරයියා ඊළඟයා යි. ඔහු කුණු කසළට කැමැති නිසා බැදී වැදුණා. ඊළඟ අයියා තලගොයියා යි. ඔහු ගොවිතැනට කැමැති නිසා ගොවි පළවල් ඇසුරු කරනවා. කටුස්සා මා ළඟ ම අයියා. ඔහු මා ඉන්නා ගෙදර වත්තේ නිතර ගැවසෙනවා.

බෝදිලිමා කියා මට තව නෑහොවුරකු ඉන්නවා ය යි මා ඉන්නා ගෙදර මිනිසුන් කියනවා මට ඇහුණා. ඒ මිනිසුන් කියා මාත් ඒ අයියා තව ම දැකලා නෑ.

මිනිසුන් ගෙන් මට කිසි කරදරයෙක් නෑ. රෑට මා බිත්තියේ ඉන්න විට සමහර ළමයින් ඉරටේ බත් බත් ඇට අමුණා මට කවනවා. මාත් ඉතින් කනවා. මට මිනිසුන් උදව් කරන නිසා මා ඔවුනට සැත්තර කියනවා. මගේ රස්සාවත් එය යි. එහෙත් ඒ ජීවත් වීමට කරන දෙයෙක් නො වේ.

මා ජීවත් වන්නේ මිනිසාට කරදර දෙන මැස්සන් මදුරුවන් වැනි සතුන් දඩයම් කිරීමෙනි.

මගේ දඩයම කිරීමෙහි ද අමුත්තෙකි. අද ඇතැම් නිවටයන් කරන්නා සේ පිටිපසින් ගොස් හොරා කුලල මිරිකීම මට පුරුදු නැ. මා දඩයම් කරන්නේ ඉස්සරහින් ම ගොස් ය; එවටත් හැලැවී යතොත් එ සේ යන්නට විටක් ලබා දී ය. බුදු දහමින් හික්මෙන්නට පෙර හෙළයාත් මගේ මේ දඩයම් පිළිවෙළ දැනගෙන උන් බව දෙවන පැතිස් රජු ගේ කතාව කියවනවා ඇසී මා දැනගත්තා.

වත්තිය

නන්ද දීසානායක

කටු මැටියෙන් සැදි මොහොවට
කුඹා පැල්පතින් විසිතුරැ
ඇත එ පිට පිටිසරබද
වත්තිය ඇදගනී ම-කද.

නගරේ හැම දේ ම මිලට
ගත හැකි යැ යි කියන නමුත්
මෙහි ඇති සන්සුන් බව කොයි
නුවරින් ගත හැකි ද මිලට?

කුරහන් මපුරනී ගොවියෝ!
ගෙවි ලිය ඒවා අඹරනී
දරුවෝ සිය මවු පිය හට
අත්වැල් වී දළස ගෙවනී

අප දුටු විට මෙහි ගැමියෝ
මහ පුදුමෙන් බලා හිඳිනී
ඉක්බිති නතු විමසා ගෙට
කැඳවා සැලැකිලි දක්වනී.

සුළඟ

කාන්ති රත්නායක

පා නැති මුත් මා ඇවිදිනවා
මේ ලොව වට කොට ඇවිදිනවා
පා ඇතියන් ගමනෙහි පසු බස්වා
දිව රෑ ඇවිදිනවා

මා කිපුණොත් හරියට ම සැර ගි
ගමනක් කඩිසර බවට වැටෙයි
ගහ් කොළ ගැමින් මා දිව යන විට
මහ ගස් ගල් පෙරළෙයි!

මුළු ලොව් සත හට පණ දෙන්නේ
මා මිස වෙන කවරෙක් වත්නේ?
එ හෙයින් මිහි පිට වන මහ දෙවියා
මා බව දැනගන්නේ!

මල් වත්ත

ලලිතා වන්නිනායක

සමන් පිච්ච ඉද්ද රෝස
නන් පාටින් මල් පිපිලා
ලස්සන සිත්තමෙක් දිලෙයි—
මගෙ මල් වත්තේ.

මීමැස්සන්, සමනළයන්
මලින් මලට යමින් එමින්
පණිවිඩ ජේවයෙක යෙදෙයි —
මගෙ මල් වත්තේ

බුදු රැස් පාටින් කදිමට
බුදු ගුණ සුවඳින් මිහිරට
මල් පිබිදෙයි බුදු පුදයට—
මගෙ මල් වත්තේ

පහදුව

1 පැල සිඳුවන සිසි සස්කර

සකසුවාණෙනි,

සරසවි පිවිසුම් සෝදිසියට නියම් සංස-යෙහි ඉහතැ සඳහන් කවිය තත් සැටියෙන් තෝරනු අසන්නට ලැබේ. කෙනෙක් සිසි සස්කර (සඳ නමැති ගොවියා) අහස් කෙතෙහි තරු නමැති සස් වග හිරු ගොවියා ලවා කප්-පන කල්හි යැ යි අරුත් බෙණෙති. තව කෙනෙක් සඳ ගොවියා අහස් කෙත පැලැහි (චිත්‍රස්සි) දුවන කල්හි යැ සි ද කියති. තව ද කෙනෙක් සිසි සස්කර පැල (බටහිරි) සිඳු (මුහුදේ) වන (වන කල්හි) යැ සි ද ගනිති.

මේ පැදිය ඔබ තෝරන්නේ කෙ සේ ද?

—සුදත් වීරසෝන්

හබරාදූවේ
උණුමෝදර මිහ විදුහලේ දී යැ.

['පැල සිඳුවන සිසි සස්කර අහස් කෙත' යනු තිවැරැදි පෙළ සේ අපට හැඟේ.

මෙහි පැල නම් පැල් අරුත්හි පැල සි. කෙතෙහි ගසන පැලෙහිත් හේනෙහි තංවන පැලෙකිත් වෙනසෙකි. හේනේ පැල හේන හිරැ වූ පසුත් එ සේ මැ තිබෙන්නට හරිනු යැ සිරිත. එහෙත් කෙතෙහි ගසාගන්නා පැල ගොවියා කෙත අනෙකකුට පවරත් මැ ගලවා ලීම යැ සිරිත.

මෙහි සඳ ගොවියා කෙලෙස් එය සි. ඔහු ගේ වාරය කෙලවර වී අහස් කෙත දමා යන්නට සිදු වන විටැ සේ පැල සිඳුවා ලී යැ.

දැන් මෙ පැදියෙහි අවුලක් නැතැ යි සිතමි

—සකසු]

2. කුල දහම් පැවැතුම

1965 — 1967 පොදු සහතික පත් විබෙ-දුමට නියම 'නවීන පද්‍යයෙහි' කුමරතුඟු මුනි-දසුන් ගේ 'මේ රට හැටි' මැයෙන් එන පැදි පෙළෙහි එන මුල් මැ පැදිය මේ වෙයි.

'නිදන පැදුර හිඳිනා අස්න කන පත
බදන බොන දරන නම කර බඳින කන
වදන තැන ද යන සත දූ යි සිහළ සත
රදන කුල දහම් පැවැතුම් කුමක් වන'

මේ පැදියට සපිරි වටහවුමක් ඔබ ගෙන් පතමි.

—සුදත් වීරසෝන්

[නිදන පැදුර යැ, හිඳිනා අස්න යැ, කන පත (පිඟාන) යැ, බොන බදන (භාජන) යැ, දරන නම යැ, කර බඳින (විවාහ වන) කත (කාන්තාව) යැ, වදන තැන (නිවෙස තැන හොත් වදනෙහි තැන) යැ යන සත් කරු-ණෙහි දී සිහළ සත හෙවත් සිංහල ජනයා රඳන්නා වූ කුල දහම හෙවත් දූ ගති පැවැත්ම කුමක් වැනි ද යනු මෙහි අරුත් පෙළ ගැසම සි.

ඒ එක ද තැනෙකැ දී වත් සිංහලයා ගේ කුල දහම් රැක්මක් නැති බව කී සැටි සි.

—සකසු]

3. කුරුණෑගොඩ

එළියේ වෙසක් කලබේ පහදුවෙන් කුරු-ණෑගල කුරුණෑගල යැ යි ගෙනැ නිපැදියාව දක්වන ඔබ, 'රුවිත් ඇතුට තැ නම් ඇති ගල' යන අරුත දෙති. එ විටැ කුරුණෑගොඩ යන්නෙහි නිපැදියාව කෙ සේ ද?

මිහරගම —විමසු

කුරුණෑගොඩ යන නන්හි අපට පෙනෙ-නුයේ හතුවා (හතුවා ගේ) පියෙදිගම, යක්-දෙස්සාගල, මරියාකාඬේ, නෝනාගම ඈ නන්හි එන්නා වැනි අරුතෙකි. කුරුණයා ගේ ගොඩ > කුරුණයා ගොඩ > කුරුණා ගොඩ > කුරුණෑගොඩ වී දූ යි විමැසියැ යුතු.

—සකසු

4. දෙමළ ගම් වූ සිංහල ගම්

එළියෙහි ගිය කලබින් ඔබ කළ ඉල්ලීම ඉටු කරමින් මා, මේ හා එවන දෙමළ ගම් නම්හි පලමු කෙළ රුව දක්වනු මැනැවි.

රම්නා විලියම්
මරිච්චිකඩේ, මුල්ලිකුලම්, පූකුලම.

[ඔබේ වදන් වැලෙන් තෝරාගැනුණු නම්

කිහිපයෙකැ තැසුණු හෙළ නම් මෙයින් මතු කරමු. සෙසු නම්හි ද තැසුණු රුව ඉඩ ලද සැටියෙන් මෙහි පළ වනු ඇති.

මරිච්චිකට්ටි	—	මිරිස්වත්ත
මුල්ලිකුලම්	—	මුල්ලේවැව
පූකුලම්	—	පූවැව.
පාවක්කුලම්	—	පුවක්වැව
උළුක්කුලම්	—	ඉළුක්වැව
නාවක්කුලම්	--	නාවවැව
ඉලන්දකුලම්	—	ලත්දේවැව
කරඩිකුලිය	—	කරඳ පෙදෙස (සිංහල පෙදෙස යනු කුලි යෑ යි හරවාගැනිණි)
පාලකුලි	—	පහළ පෙදෙස
මට්ටක්කුලිය	—	මට (තැනිතලා) පෙදෙස
පල්ලිමුණේ	—	පැල්මුණ
පංඩාරවෙලි	—	බංඩාරවෙල
මේකත්වෙලී	—	මේහෙතැන්වෙල
වවුනි	—	වැව්නිය (වැව් + ඇති > වැව්නි; බරනි, වැරනි ඈ නම්දුනු (තද්ධිත) නම නිපත් අයුරින් මැ තැනුණු නමෙකි. වැව් ඇති පෙදෙස යනු යෑ අරුත) — සකසු]

5. කදෑ

මට මතක යි කිඹ යම් එළිය කලඹෙකැ Glass යන ඉංගිරිසි වදනට කදෑ යන හෙළ වදන දී තිබුණා. එහෙත් කදෑ නම් මැටි යැ යි කෙනකු කියනවා. මේ ගැනැ ඔබ ගේ අදහස දැනැගනු රිසියෙමි.

— දැනුම් පිපි

කොළොඹ, මිහි තෙල් මඩුල්ල

[කදෑ (සකු - කාච) නම් වීදුරු යි. කදෑ මැටි යනු පිහන් මැටි යන කත්හි එන්නා වැනි වගරෙකි 'ලොබින් කදෑ මැටි මිණි යැ යි රැගත් ලෙද' යනු අලගියවන්නයන් ගේ යෙදුමි. ඉහුදු පෙනෙනුයේ ඒ අදෑ අප මැටි නමින් ගැනෙන්න නොවන බව යි. —සකසු]

6. හෙළ වදන්

පහතැ පෙනෙන මුසු වදන්වලට හෙළ වදන් කවරේ ද?

අධිකරණ අමාත්‍යාංශය
ස්ථිර ලේකම් තුමා
පිස්කල් තුමා
පිස්කල් කාර්යාලය
මහේස්ත්‍රාත් තුමා
දිස්ත්‍රික් විනිශ්චයකාර තුමා
රික්වැස්ට් උසාවිය
රික්වැස්ට් කොමසාරිස් තුමා

— සා. වි. ල. ද. ආබෙව

කොළොඹ, දිසා උසාවිය.

[අප සලකවන හෙළ වදන් පිළිවෙළින් මෙ සේ වෙයි.

විනිස ඇමැතිය
තිර ලේකම් (සකසුරු)
අය තිලදුරි
අය තිල කම්දෙරුව
රද විනිසුරු
දිසා විනිසුරු
අයැදුම් විනිසහල
අයැදුම් කමිසුරු

— සකසු]

පරයන් පැන්නුම

සුනිල් සාන්ත

පුනගැයිය { හෙළ දුවේ—හෙළ පුතේ,
ඇයි ද තව මැ නිදි මතේ.

1. ගලකි දෙමළ හැඩි තළේ,
මෙ හෙළ රට පුරා.
අපේ ගෙදෙර උනට දෙමින්
අපි යමු බැද්දේ

2. දඹදිව්යෝ හෙළදිවේ,
හද මතැ වන්නෝ.
හෙළයෝ සිය මුතුන් සොයා
බින්තැති යන්නෝ.

3. දඹදිව්යෝ එකතු වී,
හිමි කම් හෙළයේ,
පතා නගන වහා හඬෙකි
අද හැම පැත්තේ.

4. ගැමුණු එඩිය වඩා—ලා,
හෙළයන් කැටි වී,
හතුරු වැ එන හැම පරයන්
පන්නා — ලන්නෝ

කවි විනිසුම

සාගර පලන්සූරිය ගේ 'ශ්‍රද්ධාව'

-- දෙවු සෝදිසියට සැරසෙන්නවුන් සඳහා යි --

නුවන්සිරි ජයකුරු

ඉමි කවි පෙළෙන් දැක්වෙන්නේ සිතඟ උපදවන කතා පුවතෙකි. තැණවත් බවෙන් තොර වැ බැතියක් හට ගත් විටැ සිදු වන දෑ මෙයින් දැක්වෙන්නේ යි. ඒ කතා පුවත අප ඉදිරියේ තැබීමට කිවියා කළ තැත කොතරම් දුරට සපල වී දැ යි අපි දැන් සලකා බලමු.

බාරොන් උපාසකයා සැදැහැවතෙකි. ඔහු ගේ ඉරියවු පවා ඒ මැනැවින් විදහා පායි. බණ හොඳ හැටි පිළිපදින්නෙකි හේ. මහලු බවට පත් වූයේ ද වන්දනාව නිසා මැ යි. කිවියා දක්වන මේ කරුණුවලින් අපට පෙනී යන්නේ බාරොන් සැදැහැවත් ජීවිතයක් නො කඩවා ම ගත කළ තැනැත්තකු බව ය. මෙහි එන 'පෙණේ' යන පදය 'පෙනේ' වියැ යුතු ය. 'පෙණේ' යන්නෙන් නා පෙණය මිස පෙනීමේ අරුතක් නොලැබෙන හෙයිනි.

අන් උපාසකයන් සේ ම බාරොන් ද නො අඩු ව වන්දනා ගමන් ගිය බව පෙනේ. සැදැහැ ගුණයෙන් ඔහු සම වන තැනැත්තකු නැති බව කිවියා මෙහි සඳහන් කරන්නේ සිය කතා පුවතෙහි දී වුව ද ඔහු දක්වන දැඩි බුදු බැතිය කියවන්නාට වටහා දීමට ය.

බරොන් කො තරම් වෙහෙර ගැන දන්නේ ද යන් ඒවායේ නැන් කටපාඩමෙන් දනියි. එ තැන් සිහිනයෙන් පවා ඔහුට පෙනෙන නිසා ය ඔහු ඇතැම් විටැ සිහිනෙහුදු දෙ දණ බිම අනින්නේ. මෙ පමණ හොඳින් වෙහෙරවල් පිහිටි තැන් දැනීම ම පසු ව බාරොන් හට මහ අවුලක් වූ බව කවි පෙළ කියවන විට වැටැහෙනු ඇති.

හඳ ඇති පසළොස් වක් දිනෙකි. එ ද බණ දෙසීමෙකින් පසු උපාසකයා නින්දට වන් බව කිවියා පවසයි.

'බණ දේසනාවෙන් පසු මැද යම් රැයක' යනු කිවියා පවසන කල බණ දෙසුම් කෙළේ බාරොන් උපාසකයා ද නැතහොත් ඔහු බණ දෙසුමකට කන් දුන්නා ද යනු සැක සහිත ය. ඒ කෙ සේ වුවත් කිවියා අදහස් කරන්නට ඇත්තේ ඔහු සිත පිරිසුදු ව පැවැතුණු විටෙක නින්දට ගිය බව ය. මෙහි එන 'සැරසුණී' යන පදය 'සැරැසුණී' යැ යි සිටියැ යුතු.

උතුරු දෙසට පය ලා නිඳගන්නට බාරු සිතී ය. එහෙත් ඔහුට සිහි වූයේ රුවන්වැලි සැය යි. ඔහු වෙහෙර ගැන දත් කරුණු නිහට වද දෙන්නට වූ සේ ය! ඒ දෙසට පය ලෑම නුසුදුසු බව සිතූ බාරොන් නැඟී සිටියේ ය.

ඔහු අනින් මඟ මැ වරදෙක් විය. එයට කමාව අයැදී හෙ තොම දකුණු දිගට පය ලා නිඳන්නට විය. මතක් වූයේ තිස්ස මහා විහාරය යි. නවත් වරදෙක් සිදු විය. හේ යළි දු නැඟී සිටියේ ය.

බස්නාහිර ඔහුට මතක් විය. පය ලා නිඳ ගත යුත්තේ ඒ අතට බව ඔහුට සිතිණි. එ සේ නිඳන්නට විය හේ. මෙහි එළි සමය තකා 'බාරොන් උවසු තුමා' යැ යි සඳහනි, 'තුමා' යනු එළි සමය තකා යෙදුණු සේ ය. බාරොන් ගැන කීමේ දී 'බාරු' ඈ විසින් දක්වා හදිසියේ නැතෙක උවසුතුමා යැ යි දැක්වීම නො යෙදේ.

වැඩි වේලා නො ගොස් ඔහුට කැලණිය

සිහි වූ නිසා නැගී සිටින්නට සිදු විය. ඉක්බිති ඔහු පා ලැවේ නැගෙනහිරට ය. එහි මහියංගණ වෙහෙර වූ බව ඔහුට මතක් වූයේ එ විට ය. මෙහි 'වැටිති' 'නැගිති' යන පද 'වැටිණි' 'නැගිණි' යි සැකැසුණේ නම් මැනැවි.

වෙන කිසි ම දෙයකට පා ලැමට නො හැකි විය අහසට හැර. ඔහු මාගල වැලැඳ නිදගන්නට සැරසුණු බව කියැවේ. ඒ කුමක් නිසා දැ යි සැක සහිත ය. එහි වැතිරී මිස එය වැලැඳ නිදනු නොසිරිති.

සිළුමිණි හා සළුමිණි සැ මතක් වීමට කල් ගත නො විණි. එක ම සරණ සිට— ගෙනැ සිටීම ය. රිය එ සේ වත් ගත කරන්– නට බාරුට සිතිණි. එළි වැල ගැන්මට 'ඇති', 'නැති', 'පැති' යන ඈ මිසින් 'ති' යන්න දික් ගැස්සුණු සේ ය. 'නැගිටපි' යනු වියත් වහරින් ඈත් වීමක් සේ ය.

නා ලොවි සැය පොළොව දෙස නො වේ දැ යි ඔහුට සිතිණි.

'ඩැහැගත් කලක මෙන් විසකුරු සපකු විසින්' 'සපකු විසින් ඩැහැ ගත්' යනු විය– රණය අනින් ද සදොස් ය. විසකුරු සපකු විසින් ඩැහැ ගැනුණේ කෙ සේ ද යනු පැන– යෙකි. තව ද එ සේ වූ කල (ඩැහැ ගැනුණු කල) උඩ පැනීම අසීරු කරුණි. දෙ අත් මත පා තැබීමෙන් වරද මග හරවා ගත හැකි බව සිතූ බාරොන් එ සේ නිදන්නට විය.

බාරොන් හට එළිවන තුරු මේ සේ සිටින්– නට සිදු විය. කිවියා අවසනට පැනයක් නගයි.

"කොහොම ද කකුල් උඩ ඇත්තන් නිදියන්නේ ද සැදැහැවත් හෙයින් තව නැත වැටැහෙන්නේ" මෙසින් කිවියා දක්වන්නට ඇත්තේ විමැසිල්ලෙන් තොර සැදැහැවක් බවට නො අඩමාන ය. ඒ හැරත් නිදනු පසෙක තබා ඇවිදිනු කෙ සේ ද යනු පැනයෙක් මැ යි. මේ කවි පෙළ වත්මන් ලොවෙහි දු සීමාවක් විමැසීමක් නැති පුහු, බැහැරි සැදැහැයෙන් යුත් අය සිටිනු දුක කිවියා ලියන්නට ඇතැ යි සිතිය හැකි.

කිවියා ගේ බස් වහර සලකා බලන කලැ සුගම යැ යි කිව හැකි. එහි අකුරක් කොට් කොට විරිත රැක ගත් තැන් කිහිපයෙක් දක්නට ලැබිණි: 'මිනිහට' 'ඒවයේ' ඈ විසිනි ඒ. එහෙත් අන් බොහෝ කිවියන් අතින් සිදු වන පොදු දොස්වලින් කිවියා බොහෝ කොටැ වැළැකී ඇති බව කිව හැකි ය.

මේ කවි පෙළ මුල සිටැ අග දක්වා හැකි රසයෙන් යුත් බව කිව හැකි ය. ඇතැම් විටැ කිවියා 'නැගිටපි', 'පැනපි' ඈ වදන් යොදන්නට ඇත්තේ කවියට අමුතු පණක් දී හැසි රසය වඩන්නට දැ යි සිතේ. බාරොන් ගේ විමැසිල්ලෙන් තොර සැදැහැව මේ කවි පෙළෙන් මැනැවින් උවහසට ලක් වූ බව කිව හැකි සි.

'කවි යැ යි දූන් නුගතුන් විසින් ගැනෙනුයේ ......අනක් මනක් යැ, උගතුන් විසින් ගැනෙනුයේ පැරැණි බණ පොත් යැ. රස හඳුනන්නවුන් විසින් ගත යුත්තේ එ දෙ පස මැ නො වේ, ගිරිකීමට ඇදූයැනීමට සුදුසු රසයක් ඇති පබදෙකි. කාටත් තේරෙන ගම් වැදි සරුප නො වේ'

[සුබස]

පාසල් පොත් (130 පිටුයෙනි)

ගනන පාරිභාෂික වදනින් මරන මරන කෙළ වදනට රුපියල් දහ හත සි පනහ (රු. 17/50) කැයින් මහ ජන මුදල් කන්නෝ යැ. දූත් උනට, මේ බරවා වදන් රජයේ පතපොතට ඇතුළු කොටැ ළමයින් පිටැ පටවාලීමේ වරය මෙයින් තිනැතිත් මැ පැදෙයි. මේ පොත් උගන්නා දරුවෝ පාරිභාෂික බරවා ලෙඩින් එකයින් මැ ඔත්පළ වෙති; නගරයේ කම්කරු දරුවා යැ, ගමේ ගොවි දරුවා යැ, යන වෙනසක් නැති වැ මුළු රට පුරා වසන සියලු කෙළ දරුවෝ මැ එ කලැ මේ ලෙඩින් නොමිදුණෝ වෙති.

කොලොන්නාවේ තෙල් රඳුරෙහි (ශබඩාවේ) වැඩ කරන කම්කරුවා ගේ පුතු නෙත් සිය පියා රැකියාව කරන්නේ කොහි දැයි විමැසුවොත් එ කලැ ඔහු ගේ පාරිභාෂික පිළිතුර 'තෙල ජලාශයේ' යැ යන්න යි. ඉංගිරිසියෙන් රිසෝව' **Reservoir**) යන්නට පාරිභාෂික වදන ජලාශය යි. මේ නියරින් තෙල් රඳුර, තෙල ජලාශය යි.

'කන්දන්නේ කුඹුර වැස්සට සෝද පාළු දිණා' යැ යි කියන ගොවිරාල ගේ පාරිභාෂික පුතා එය මැ 'සමෝච්ච කුඹුර වෘෂ්ටි පාතයෙන් පරිනග්නීකෘත වූණා' යැ යි පවසානවා ඇති! කඳු ඇළයේ දත්නට ලැබෙන්නා වූ ද කෙළ ගොවියන් කන්දනි කුඹුරු යැ යි කියන්නා වූ ද පිය ගැට බැඳු වැ ඇතට දිවෙන කුඹුරුවලට සමෝච්ච කුඹුරු යනුත් සෝද පාළුවට පරිනග්නිකරණය යනුත් පාරිභාෂික කම්මිලේ වදන් යැ!

හෙවත්තෙන් මල් පැළයක් උදුරාගෙනැ එන දූරිය ගෙන් ඔය කුමක් කළා දැ යි අසන මවට දැන් ලැබෙන්නේ 'සපුෂ්පක ශාකයක් මූලෝද්ධරණය කැරගෙනැ ආවා' යන්න වැනි පිළිතුරෙකි. සපුෂ්පක ශාක යනු මල් පැළයට පාරිභාෂාව යි! ඇත්තට මැ මේ විහිළුව කිමෙක් ද?

තව, සවසංක්‍රිය, ශ්වසනය, ප්‍රවිස්ථාපනය, නිර්ජාකිරණය, තිර්ගුණෝෂ්මි, පක්ෂ්මීය චලනය, ප්‍රක්ෂේපනය, දණ්ඩ චුම්බකය, චුම්බක ක්‍රාන්තිය, සෛද්ධාන්තික ජ්‍යාමිතිය, ගුණන සාධනය අභිසාරි ශ්‍රේණිය, විද්‍යුත් ස්ඵෝටකය, ලුප්ත හෙරුව ඇ දහස් ගණන් පාරිභාෂික වදන් කෙළ දරුවා ගේ පාසල් ඉසව් මාලාගෙහි වෙයි. පිනුම් උගන්නට දියට බස්නා එකා ගේ බෙල්ලේ මහ කළු ගල් ගෙඩි එල්ලීමත් ඉගෙනැ ගන්නට සැරසෙන අසරණයා පිට මේ පාරිභාෂික වදන් පැටැවීමත් එක් බඳු යැ.

ළමා පතපොතට ඇතුළු වන සිප් වදන් වෙසෙසින් මැ ලිහිල් විය යුතු යැ; සිංහල විය යුතු යැ. සිංහල ගොවියා ගේ සිප් වදන් අතරෙහි වන කමත, පාවර, නියර, වේල්ල, කුඹුස්ස, පේහුම, අත්තම, කයිය, වැදම යන වදන් බැලුව මැනැවි; සිංහල වඩුවා ගේ වැය, නියන, කියත, අතකොළුව, තොරපහය යන්න ඇ සිප් වදන් බැලුව මැනැවි. මසුන් මරන්නා ගේ ඔරුව, රුවල, ඇණිය, අවල, කොල්ලෑව ඇ වදන් බැලුව මැනැවි. මේ හැම ලිහිල් යැ; සිංහල යැ; නැමියාවෙන් ද යුතු යැ. එහෙත් රජයේ පාසල් පතපොත මඟින් මේ හැදෙන පරපුර පාරභාෂික වූව හොත් ඉහතැ කී සිප් වදනින් මතු වන සිංහල උවරුවට ද මරු කැපෙයි.

තව වරදෙක් වෙයි. එ නම් හොඳ මැ සිප් වදන වහරට වැටීමේ ඉඩ ඇහිරී යැම යි. නිදසුනක් දෙකක් විමසා බලමු.

ටෙලිපෝන්' යන ඉංගිරිසි වදන වෙනුවට මුලින් මැ තැනුණු දුර කථනය, දුර භාෂණය යන නම් අද වහරෙහි වේ ද? නැති. දුරකථනය, තෙලබනුව යන නම්වලට ඉඩ දී අර වදන් වහරින් කැළී ගියේ යි. 'සිලෝන් යුනිවර්සිටි' යන්නට මුල් මැ අවදියේ කී 'ලංකා සරස්වතිය' යන නමට කිමෙක් වී ද? ලක් සරසවිය යන්නට විට දී අයින් විය. තව මෙ සේ මැ 'ආංඩුව' 'රජය' විය.; 'ආණ්ඩුකාරයා' 'ලකිසුරු' විය; අග්‍රාමාත්‍යයා' 'අගමැති' විය. මෙ සේ මේ අවුරුදු කීහිපය තුළැ මැ සුදුසුතර සිප් වදනට ඉඩ දී වහරින් ගිලිහුණු සිප් වදන් රැසෙකි. එහෙත් මේ පාරිභාෂික වදන් පාසල් පතපොතට කාවැදීමෙන් පසු වනුයේ කිමෙක් ද? අර මුලින් කී සේ හොඳ මැ සිප් වදන් වහරට වැටීමේ ඉඩ නැති වැ හොස් අන්තිමට සිංහලය අසිංහලය සේ ඇසෙන බසක් ඇති වීම යි.

රැසේ මරනය ඒ නැනැ යැ.

දවල් ගීතය

ඇල්පිටියේ
පො. ආ. ස. විජයරත්න

යට ගිය දවසැ බරණැස් නුවර බඹදත් නම් රජ කෙනෙක් රජය කෙරෙති. උහු තුමූ එක් දවසෙකැ උයන් කෙළියෙන් විඩා වැ, මී මෙදෙන් මත් වැ මඟුල් උයනෙහි සැතැපෙන්නාහු, මෙ බඳු සිහිනයක් දුට හ.

"දඹදිව් තලෙහි වූ හාස් දතවූ වැසි පිරිමි ගොවි තම්, වෙළෙඳ තම් හැර-පියා 'තම් හ, මරම් හ, ලේ වගුරුවම් හ' කියමින් කැති, ඵපාලු උදලු, දඬු මුගුරු, මෝල් ගස් ඈ කර තබාගෙනැ දහලති; පිරිමින් සටනට යා දී, අඹු රට රජයම් හ යි ගැනු ඉවුම්, පිහුම්, දරුවන් නැනුම් ඈ හැර-දමා මත් පැන් බී නටති.

කෙල්ලෝ එළි මහතෝ නැටුම් ගැහුම් ඈ කොල්ලන් හට අයිති සියලු වැඩ කෙරෙති; කොල්ලෝ දණින් සෙනෙත සේ කොට ගවුම් ඇඳැ-ගෙනැ දෙර අත්තරී වී මඟ යන්නවුන් දෙස එබී බලති.

බිලිඳෝ වී වපුරති; ගෝන් රකිති ලුනු, මිරිස් වවති; අඟර ද පිසිති; තමනට දත් නැති හෙයින් බත් නොකා ඇඟිලි බී කුස-ගිනි නිවා-ගෙනැ මුදල් රැස් කෙරෙති; වැඩි-හිටියන් නාවා කවා පොවා සුරතල් ද කෙරෙත් මැයි.

රජ යුවරජ ආදීහු පොල් කටුව අතින් ගෙනැ හිඟමනට බසිති. හිඟමන් ලැබුණු කල බණිමින් ගොරවමින් ගෙනැ-ගොස් අඩක් වළඳ අඩක් වේලති; හිඟන්නෝ සිඟපුත් අප රජ-යුවරජ කම් කෙරෙති.

මහණ බමුණෝ පොත් විකුණති; වෙතත් කටයුතු ද නොකටයුතු ද කෙරෙති ගිහියෝ තව ගුණ වැළ අතින් ගෙනැ බවුන් වඩති බණ කියති; පිඬු පිනා-යෙති.

මහල්ලෝ දණ-ගාති. ඔබ මොබ කෙළි ඇවිදිති. සියලු බිලිඳු කම් කෙරෙති. එ අතර දිරාගිය රැහැනක් කැඩී තොටිල්ලෙක් බිම හිණි. එහි උන් මහල්ලා 'අම්මේ! අම්මේ!' යි කියා මවට හඬ-ගාමින් බිමැ පෙරළි-පෙරළී මහ හඬින් හඬන්නට විය. එ හඬට මැ රජු ගේ ඇස ඇරිණි.

තපුරු සිහිනයෙකැ යි රජහු බිය පත් වැ වට පිට බලන්නාහු, තව මැත් පැසෙ-මින් අඩක් ඉතිරි වැ තුබූ මී බඳුන දැක 'දවල් ගීත සිසරු යැ' යි කියා එ ද බිඳ කොටැ නැවැතැ ද සැතැපුණෝ යැ.

○ මාතර අමරදාස සමරවීරයන් ගේ

හදවත නැති ගෙනහුරුව

විචිසුව සඳහා අපට ලැබී ඇති නළුවෙකි.
විචිසුව ලබන එළියෙහි එයි.

○ පැදි - නළු - කෙටි කතා තරඟ පල

ලබන කලබට තබන්නට සිදු වී ඇති හෙයින්
පබඳුවනට තව ද කල් ලැබෙන බව සැලැකුව මැනැවි.

දැනුම

දැනුමැ'ති සත
ටිය ගිය අත
ලබා සැපත
බැබැළෙනු ඇත

ඔබේ දැනුම
පිණිස 'දැනුම'
හොඳ යි අද ම
ලබා – ගැනුම

'දැනුමෙණි' මිල
වෙයි රුපියල
සුළු යැ ඒ මිල
විපුල යැ ඵල

කොළොඹ -1
ගපූර් මන්දිරයේ – 29 1/9
දැනුම ප්‍රකාශකයෝ

ඇයි මේ පොරය ?

එඩියේ 4 වෙළුම සඳහා යැ.

පමා වී නොහැවෙන්නැ

එඩියෙහි 4 වෙළුමේ සියලු කලප් සහිත
මූළමනින් බැම්ම රුපියල් දහය සි.

පහිණ වැය නොමිලේ සි.

සීමා සහිත

ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

කොළඹ - මහනුවර - ගාල්ල - මීගමුව - අනුරපුර
මාතර - යාපනය - කුරුණෑගල

ගල්කිස්සේ හුළුදාගොඩ පාරේ 20/1 හි නිවැසි ලියනගේ ජිනදාසුන් විසින් එ තන්හි මැ පිහිටි අජිත්